

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2021

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව මඟින් අධ්‍යයන කටයුතු සහ ජයග්‍රහණ සම්බන්ධව ආයතනික දළ විශ්ලේෂණයෙහි සවිස්තරාත්මක සාරාංශයක් සපයයි. මෙහි අඩංගු තොරතුරු අදාල පීඨ/ දෙපාර්තමේන්තු/ අංශ/ ඒකක මඟින් සපයන ලද අතර තොරතුරු හා සංඛ්‍යාන ඒකකය මඟින් සම්පාදනය කරන ලදී.

දැක්ම

විද්‍යාව, තාක්ෂණය, සහ මානව ශාස්ත්‍රය පිළිබඳ උසස් අධ්‍යයනය සහ නවෝත්පාදන සඳහා වූ දකුණු ආසියාවේ ජාත්‍යන්තරව පිළිගත් කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.

මෙහෙවර

කලාපීය සහ ජාතික අවශ්‍යතාවයන්, සාමාජීය සහයෝගීතාවය සහ සමාජ සමූහයන් සවිබල ගැන්වීම සහ තෘප්තිමත් කිරීම ඉලක්ක කර ගනිමින්, දැනුම සහ නව නිපැයුම් උත්පාදනය කිරීම හා බෙදා හැරීම තුලින්, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ උසස් අධ්‍යාපනය සඳහා පුළුල් අවස්ථාවන් සලසාදීම .

අරමුණු

1. අධ්‍යයන ගුණාත්මකභාවය පිළිබඳ විශිෂ්ඨත්වය.

2. පර්යේෂණ, නවෝත්පාදන සහ දැනුම ව්‍යාප්ත කිරීමේ විශිෂ්ඨත්වය.

3. සමාජ හා කාර්මික අපේක්ෂාවන් ආමන්ත්‍රණය කිරීමේ විශිෂ්ඨත්වය.

4. යටිතල පහසුකම් හා මානව සම්පත් සංවර්ධනයෙහි විශිෂ්ඨත්වය.

5. ජාතික හා ජාත්‍යන්තර සහයෝගීතාවයේ විශිෂ්ඨත්වය.

6. යහ පාලනය සහ තිරසාර භාවය පිළිබඳ විශිෂ්ඨත්වය.

උපකුලපතිවරයාගේ පණිවුඩය



මහාචාර්ය ඒ.රමීස්

සිසුන්ගේ, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජයග්‍රහණයන් පදනම් කර ගනිමින් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ සමස්ත ජයග්‍රහණයන් **2021** වාර්ෂික වාර්තාව තුලින් ඉස්මතු කරනු ලබයි. **2019** සිට **2024** දක්වා ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාලයේ උපාය මාර්ගික සැලැස්මෙහි දක්වා ඇති ඉලක්ක වලට සමාන්තරව සමාජ, සංස්කෘතික, කලාපීය හා ජාතික සංවර්ධනයේදී විශ්වවිද්‍යාලය විසින් සිදු කරන ලද දායකත්වයන් වාර්තාව ඉස්මතු කරයි. ඊට අමතරව, විශ්වවිද්‍යාලය මුහුණ දෙන අභියෝග සහ අඩුපාඩු, සාධාරණ හේතු සහිතව අවධාරණය කෙරේ.

"සෞභාග්‍යයේ දැක්ම" හා බැඳුණු රජයේ ප්‍රතිපත්ති විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරමින් සිටී. තවද, භාණ්ඩාගාර අරමුදල් සහ AHEAD අරමුදල් වල සහයෝගයෙන් සිසුන් සඳහා සපයන සේවාවන්හි කාර්යසාධනය සහ ගුණාත්මකභාවය ශක්තිමත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් සිසුන්ට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සඳහා කුඩා ඉදිකිරීම් කටයුතු කිහිපයක්ම ක්‍රියාත්මක කරන ලද අතර එමඟින් සිසුන්ට කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම්වල නියැලීමට අවකාශයක් ලැබෙනු ඇත. තාක්ෂණ පීඨයේ අලුතින් ඉදිකරන ලද ගොඩනැගිල්ල සහ බහුකාර්ය ශ්‍රවණාගාරය විශේෂයෙන් සිසුන්ගේ සහ පොදුවේ විශ්වවිද්‍යාලයේ ප්‍රයෝජනය සඳහා උපයෝගී කර ගෙන ඇත. Scopes, Scimago, Clarivate Analytics දත්ත ගබඩා ආදී සුප්‍රසිද්ධ දත්ත පද්ධතීන් තුල සුවිගත කර ඇති, සුවිගත කරන ලද සඟරා පත්‍රිකා ප්‍රකාශනයන් සංඛ්‍යාව තවදුරටත් ඉහල නංවා ගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය කැපීපෙනෙන ලෙස දායක විය.

වෙබෝමෙට්‍රික් ශ්‍රේණිගතකිරීම්හි වර්ධනය තුලින් විශ්වවිද්‍යාලයේ ප්‍රගතිය පිළිඹිබු කරයි. තවද, විශ්වවිද්‍යාලවල තිරසාර කාර්ය සාධනය මත පදනම්ව විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කරන UI GreenMetric ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම යටතේ ශ්‍රී ලංකාවේ අංක එකේ

විශ්වවිද්‍යාලය බවට පත්වෙමින් විශ්වවිද්‍යාලය සිය ඉතිහාසයේ නොමැකෙන සලකුණක් තබයි. තවද, සුදුසුකම් සහිත අධ්‍යයන හා වෙනත් කාර්ය මණ්ඩලය සම්බන්ධ වීමත් සමඟ විශ්වවිද්‍යාලයේ මානව ප්‍රාග්ධනය ශක්තිමත් විය. ඊට සමගාමීව, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙකු මහාචාර්යවරුන් ලෙස උසස් වීම තුලින් විශ්වවිද්‍යාලයේ සේවාවන් සැපයීමේ ධාරිතාව තවදුරටත් ඉහළ නැංවී ඇත

විශ්වවිද්‍යාලයේ ජයග්‍රහණ පිළිබඳව ඉස්මතු කර පෙන්වන, 2021 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය ඉමහත් සතුටින් ඉදිරිපත් කරනු ලබයි. 2021 වර්ෂයේදී ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා වෙහෙස මහන්සි වී වැඩ කළ සියළුම දෙනාට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

මහාචාර්ය ඒ.රමීස්
උපකුලපති
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

පටුන

ශීර්ෂය		පිටු අංකය
දැක්ම		
මෙහෙවර		
අරමුණු		
උපකුලපතිවරයාගේ පණිවුඩය		
විශ්වවිද්‍යාලයේ පාලනය		01
I	පාලක මණ්ඩලය	01
II	සනාථන සභාව	03
III	සංවිධාන සටහන	06
1.	විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය	07
1.1	කෙටි හැඳින්වීම	07
1.2	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ පවතින අධ්‍යයන වැඩසටහන්	08
1.3	පශ්චාත් උපාධි අධ්‍යයන	11
1.4	ලෝක ශ්‍රේණිගත කිරීම්	13
1.5	ශිෂ්‍ය ප්‍රජාව	13
1.6	සේවක ප්‍රජාව	14
1.7	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විභිඳීම	14
1.8	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයීය පුස්තකාල	15
1.9	ජයග්‍රහණ සහ පිළිගැනීම්	20
1.10	අසාර්ථකවීම් සහ ඊට හේතු	24
1.11	අනාගත සැලසුම්	25
2.	සිසුන් සහ සම්පත්	29
2.1	ශිෂ්‍ය ප්‍රජාව සහ ස්ථීර කාර්ය මණ්ඩලය	29
2.2	දේශීය සිසුන් පිළිබඳ විස්තර	30
2.3	විදේශීය සිසුන් පිළිබඳ විස්තර	35
2.4	උපාධිධාරීන් බිහි කිරීම	36
2.5	නේවාසිකාගාර	39
3.	මානව සම්පත්	41
3.1	කාර්ය මණ්ඩල විස්තර	41
3.2	අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය	42
3.3	පරිපාලන, මූල්‍ය හා වෙනත් විධායක	43
3.4	අනධ්‍යයන හා පරිපාලන නොවන කාර්ය මණ්ඩලය	43
4.	පර්යේෂණ හා සංවර්ධන	44
4.1	පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර	44
4.2	**2021** වසරේ දී ශ්‍රී.අ.වි වෙත පැමිණි ජාත්‍යන්තර කාර්ය මණ්ඩලයේ තොරතුරු	66
4.3	**2021** වර්ෂය තුල මහජනතාවට දැනුම බෙදාහැරීම පිළිබඳ විස්තර	66
4.4	ලැබූ සම්මාන පිළිබඳ විස්තර	69
4.5	2020 වර්ෂයේදී අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය වෙනුවෙන් ලද විදේශීය අධි සාමාජිකත්ව, ශිෂ්‍යත්ව/සම්මාන පිළිබඳ තොරතුරු (සම්මන්ත්‍රණ/ වැඩමුළු/ කාර්ය මණ්ඩල සංවර්ධනය/ පුහුණු/ කෙටි පාඨමාලා)	70

4.6	විදෙස් උසස් අධ්‍යාපන ආයතන/පර්යේෂණ ආයතන/ දායක ආයතන සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් පිළිබඳ විස්තර.	70
4.7	පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වූ අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය (2021 දී දේශීය හා විදේශීය)	71
4.8	2021 වර්ෂයේදී අදාල පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කරන ලද අධ්‍යයන, අධ්‍යයන සහායක සහ පරිපාලන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර	72
4.9	වැඩසටහන්,සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර	73
5.	ප්‍රාග්ධන වැඩ	79
5.1	ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර	79
6.	තිරසාර සංවර්ධන ක්‍රියාකාරකම්	80
6.1	තිරසාර සංවර්ධන ක්‍රියාකාරකම් වල ජයග්‍රහණ	80
6.2	පරිසරය සුරැකීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග	84
7.	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර	86
7.1	ආදායම	86
7.2	උත්පාදිත ආදායම	86
7.3	ප්‍රධාන වැඩසටහන් වල පුනරාවර්ථන වියදම	86
	7.3.1 අධ්‍යයන සේවා සඳහා පුනරාවර්ථන වියදම	86
7.4	ප්‍රාග්ධන වියදම්	87
7.5	වියදම්	87
7.6	මූල්‍ය කාර්ය සාධනය විශ්ලේෂණය – 2021	87
	7.6.1 සිසුවෙකුට පිරිවැය (පුනරාවර්තන සහ ප්‍රාග්ධන පිරිවැය)	87
7.7	වාර්ෂික ගිණුම් – 2021	88
7.8	විගණකාධිපතිගේ වාර්තාව **2021**	**105**
7.9	විගණකාධිපතිගේ වාර්තාව සඳහා නිරීක්ෂණ	**114**

විශ්වවිද්‍යාලයේ පාලනය

I. විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පාලනාධිකාරය සහ ප්‍රධාන විධායක ඒකකය වන්නේ විශ්වවිද්‍යාල පාලක සභාවයි. 1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 24 වැනි වගන්තියෙන් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 44 වැනි වගන්තියට අනුව පිහිටුවන ලද විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය, 2021 වර්ෂය තුළ පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය. විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී පාලක සභාවේ ලේකම්වරයා වේ.

නිල බලයෙන් පත් වූ සාමාජිකයින්

නම	තනතුර
මහාචාර්ය ඒ.රමීස්	උපකුලපති (සභාපති) *(2021.08.09 සිට)*
මහාචාර්ය එම්.එම්.එම්.නාජිම්	උපකුලපති (සභාපති) *(2021.08.08 දක්වා)*
ආචාර්ය එස්.එම්. ජුනයිඩීන්	පීඨාධිපති/ ඉංජිනේරු පීඨය
මහාචාර්ය එස්.එම්.එම්.මසාහිර්	පීඨාධිපති/ ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා පීඨය
ආචාර්ය එස්. සෆිනා එම්.ජී.හසන් මිය. මහාචාර්ය එස්.ගුණපාලන්	පීඨාධිපති/කළමනාකරණ හා වාණිජ පීඨය *(2021.06.30 සිට)* පීඨාධිපති/කළමනාකරණ හා වාණිජ පීඨය *(2021.06.29 දක්වා)*
ආචාර්ය යූ.එල්. සෙයිනුඩීන්	පීඨාධිපති / ව්‍යවහාරික විද්‍යා පීඨය
මහාචාර්ය එම්.එම්.ෆසීල් මහාචාර්ය ඒ.රමීස්	පීඨාධිපති/ කලා හා සංස්කෘතික පීඨය *(2021.08.16 සිට)* පීඨාධිපති/ කලා හා සංස්කෘතික පීඨය *(2021.08.08 දක්වා)*
ආචාර්ය යූ.එල්.ඒ.මජීඩ්	පීඨාධිපති/ තාක්ෂණ පීඨය
ආචජර්ය එම්.එච්.හාරූන්	සනාථන සහා නියෝජිත
ආචාර්ය එස්. සෆිනා එම්.ජී.හසන් මිය.	සනාථන සහා නියෝජිත *(2021.06.29 දක්වා)*
මහාචාර්ය එෆ්.එච්.ඒ.රාවුෆ් මිය.	සනාථන සහා නියෝජිත *(2021.08.18 සිට)*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිශන් සභාව විසින් පත්කල සාමාජිකයින්	
අයි.එම්.හනීෆා මහතා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
ආචාර්ය අන්වර්.එම්.මුස්තාෆා	සභාපති/නැගෙනහිර පළාත් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මණ්ඩලය
ඉංජි.මුහීනුඩීන් අබ්දුල් කාදර්	ඉංජිනේරු/කළමනාකරණ අධ්‍යක්ෂක- බෙටා ජාත්‍යන්තර සමාගම, කොළඹ
වෛද්‍ය ටී.එස්.ආර්.ටී.ආර්.රජාබ්	වෛද්‍ය සුපරීක්ෂක, මූලික රෝහල, පොතුවිල්
ඉංජි . එන්.ටී. මොහමඩ් සිරජුදීන්	විශ්‍රාමික ප්‍රධාන ඉංජිනේරු/ මාර්ග සංවර්ධන අධිකාරිය, අම්පාර
එම්.සී.මොහමඩ් නවාස් මහතා	නීතීඥ
මහාචාර්ය කොලින්.එන්.පීරිස්	අධ්‍යක්ෂ/අධ්‍යයන සංවර්ධන සහ තත්ත්ව ආරක්ෂණ, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය
ජේ.එම්.නලීර් මහතා	ගණකාධිකාරී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මුතූර්
ඩී.එල්.එම්.බණ්ඩාරනායක මහතා	ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
මහාචාර්ය හේමා එම්.කේ.කේ.පතිරණ මිය	රසායන විද්‍යාව පිළිබඳ විශ්‍රාමික මහාචාර්ය රුහුණු විශ්වවිද්‍යාලය

ලේකම්

එච්.අබ්දුල් සත්තාර් මහතා, ලේඛකාධිකාරී

II. විශ්වවිද්‍යාල සභාව

1985 අංක 07 දරන පනත මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 46 වැනි වගන්තියට අනුව පිහිටුවන ලද විශ්වවිද්‍යාල සභාව, 2021 වර්ෂය තුළ පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය. ව

නිළ බලයෙන් පත්වූ සාමාජිකයින්

උපකුලපති

මහාචාර්ය ඒ.රමීස්	උප කුලපති (සභාපති) (*2021.08.09 සිට*)
මහාචාර්ය එම්.එම්.එම්. නාජිම්	උප කුලපති (සභාපති) (***2021.08.08** දක්වා*)

පීඨාධිපතිවරුන්

ආචාර්ය එස්.එම්.ජුනයිඩීන්	පීඨාධිපති/ ඉංජිනේරු පීඨය
මහාචාර්ය එස්.එම්.එම්.මසාහිර්	පීඨාධිපති /ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා පීඨය
ආචාර්ය එස්. සඟිනා එම්.ජී.හසන් මිය.	පීඨාධිපති / කළමනාකරණ හා වාණිජ පීඨය (***2021.06.30** සිට*)
මහාචාර්ය එස්.ගුණපාලන්	පීඨාධිපති / කළමනාකරණ හා වාණිජ පීඨය (***2021.06.29** දක්වා*)
ආචාර්ය යූ.එල්. සෙයිනුඩීන්	පීඨාධිපති / ව්‍යවහාරික විද්‍යා පීඨය
මහාචාර්ය එම්.එම්.ෆාසිල්	පීඨාධිපති / කලා හා සංස්කෘතික පීඨය (***2021.08.16** සිට*)
මහාචාර්ය ඒ.රමීස්	පීඨාධිපති / කලා හා සංස්කෘතික පීඨය (***2021.08.08** දක්වා*)
ආචාර්ය යූ.එල්.ඒ.මජීඩ්	පීඨාධිපති / තාක්ෂණ පීඨය

මහාචාර්යවරු

මහාචාර්ය එම්.ඒ.එම්.රමීස්
මහාචාර්ය එෆ්.එච්.ඒ.රාවුෆ් මහත්මිය
මහාචාර්ය ඒ.එල්.ඒ.රාවුෆ්
මහාචාර්ය ඒ.ජහුෆර්
මහාචාර්ය ඒ.එම්.මුසාතික්
මහාචාර්ය එම්.බී.එම්.ඉස්මයිල්
මහාචාර්ය ඒ.එම්.රස්මි
මහාචාර්ය එස්. ගුණපාලන්
මහාචාර්ය එම්.ඒ.එල්.අබ්දුල් හලීම්
මහාචාර්ය කේ.එම්.මුබාරක්
මහාචාර්ය එම්.අයි.එම්.කලීල්

අධ්‍යයනාංශ ප්‍රධානීන්

මහාචාර්ය ඒ.ජහ්ෆර්	ගිණුම්කරණ හා මූල්‍ය අධ්‍යයනාංශය (***2021.07.01***

	දක්වා)
මහාචාර්ය ඒ.එම්.එම්.මුස්තාෆා	කළමනාකරණ අධ්‍යයනාංශය *(**2021.07.01** සිට)*
මහාචාර්ය එස්.සබ්‍රාස් නවාස්	කළමනාකරණ හා තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය
මහාචාර්ය එම්.ඒ.එම්.ෆවුසර්	දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය *(**2021.08.16** සිට)*
මහාචාර්ය එම්.එම්.ෆසීල්	දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය (*2021.08.16 දක්වා*)
මහාචාර්ය එම්.අයි.එම්.හිලාල්	අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය
ආචාර්ය ඒ.හලීම්	ගිණුම්කරණ හා මූල්‍ය අධ්‍යයනාංශය *(2021.07.01 සිට)*
ආචාර්ය එස්. සෆිනා එම්.ජී.හසන් මිය.	කළමනාකරණ අධ්‍යයනාංශය *(**2021.07.01** දක්වා)*
මහාචාර්ය එම්.ඒ.එම්.ෆවුසර්	දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය
ආචාර්ය ආර්.ඒ.සර්ජූන්	ඉස්ලාම් අධ්‍යයන අධ්‍යයනාංශය
ආචාර්ය එච්.එම්.එම්.නලීර්	පරිගණක විද්‍යා අධ්‍යයනාංශය
සී.එම්.එම්.මන්සූර් මහතා	තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය
එම්.සී.එස්.ශතීෆා මහත්මිය	අරාබි භාෂා අධ්‍යයනාංශය
ආචාර්ය ඒ.එම්.එම්.නවාස්	ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයනාංශය
ඉංජී. එම්. අයි ඉල්හාම් ජසීල්	අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයන අධ්‍යයනාංශය
ඉංජී. එම්.සී.රියාස්	සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය
ආචාර්ය එම්.ඒ.එස්.එෆ්.සාදියා මිය	භාෂා අධ්‍යයනාංශය
ආචාර්ය එම්.එච්.හාරූන්	රසායන විද්‍යා අධ්‍යයනාංශය
ආචාර්ය ඒ.ඒ.එම්.නුෆයිල්	ආර්ථික විද්‍යාව හා සංඛ්‍යානය අධ්‍යයනාංශය
ආචාර්ය එස්. අනුසියා මිය	සමාජීය විද්‍යා අධ්‍යයනාංශය
ආචාර්ය වී.සුජාරාජිනී මහත්මිය	ජෛවීය විද්‍යා අධ්‍යයනාංශය
එම්.එච්.එම්.රිනෝස් මහතා	භූගෝල විද්‍යා අධ්‍යනාංශය
ආචාර්ය එස්.එම්.අයූබ්	සමාජ විද්‍යා අධ්‍යනාංශය
ඒ.එල්.හනීස් මහතා	ගණිතමය විද්‍යා අධ්‍යනාංශය
ආචාර්ය පී.එම්.කේ.අලහකෝන්	ප්‍රධානී /විදුලි හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යනාංශය
ආචාර්ය ඒ.එම්.එන්.එම්.අධිකාරම් මිය	ප්‍රධානී /භෞතික විද්‍යා අධ්‍යයනාංශය
ආචාර්ය ඩබ්.ජී.සී.ඩබ්.කුමාර	ප්‍රධානී /පරිගණක විද්‍යා සහ ඉංජිනේරු අධ්‍යයනාංශය
ආචාර්ය යූ.ෆාරුක්	යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය
කේ. මොහමඩ් රිෆ්ති මහතා	ප්‍රධානී / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය
ආචාර්ය ඒ.එන්.එම්.මුබාරක්	ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය *(**2021.02.01** සිට)*
ආචාර්ය එම්.එම්.මුනීබ්	ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය

*(**2021.01.31** දක්වා))*

එම්.එම්.රිෆවුදීන් මහතා **පුස්තකාලාධිපති**

පත්කල සාමාජිකයින්

ව්‍යවහාරික විද්‍යා පීඨය

එම්.ඒ.ඒ.එම්.ෆහාම් මහතා

ඒ.එම්.රියාස් අහමඩ් මහතා *(**2021.08.19** සිට)*

ආචාර්ය ඒ.එම්.රස්මි *(**2021.08.06** දක්වා)*

කලා හා සංස්කෘතික පීඨය

ඒ.වික්‍රමරත්න මහතා

එම්.ඒ.එම්.සමීම් සහතා

ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා පීඨය

ආචාර්ය ආර්.ඒ.සර්ජූන් *(2021.**01.09** දක්වා)*

ඒ.එම්.රියාස් අහමඩ් මහතා *(**2021.08.19** සිට)*

ආචාර්ය එස්.එම්.එම්.නෆීස් *(**2021.02.03** සිට)*

කළමනාකරණ හා වාණිජ පීඨය

ආචාර්ය ඒ. හලීම් *(**2021.12.12** දක්වා)*

ආචාර්ය එම්.සී.ඒ.නසාර් *(**2021.07.15** දක්වා)*

ආචාර්ය එමී.එච්.තවුෆික් *(**2021.07.19** සිට)*

ආචාර්ය අයි.රයිසාල් *(2021.**12.31** සිට)*

ඉංජිනේරු පීඨය

ඉංජිනේරු ඒ.එල්.එම්.රිසාත්

ආචාර්ය ජේ.ඒ.එස්.පී.ජයකොඩි

තාක්ෂණ පීඨය

ආර්.කේ.ඒ.රිෆායි කාරියප්පර් මහතා

ආචාර්ය ඒ.එන්.එම්. මුබාරක් *(**2021.03.08** දක්වා)*

ආචාර්ය ඒ.එන්.ඩී.ටී.කුමාර *(**2021.03.09** සිට)*

ලේකම්

එච්.අබ්දුල් සත්තාර් මහතා, ලේඛකාධිකාරී

සංවිධාන සටහන

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය



SSSW-ශිෂ්‍ය සහා සහාය සේවා සහ සුබසාදන
OSPIM- උපක්‍රමික සැලසුම්කරණය සහ ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීමේ කාර්යාලය
RIC-පර්යේෂණ හා නවෝත්පාදන මධ්‍යස්ථානය
CEDPL-බාහිර උපාධි හා වෘත්තීය ඉගෙනුම් මධ්‍යස්ථානය
CGU-වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය
SDC-කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
CGEE -ස්ත්‍රී පුරුෂ සාධාරණත්ව හා සමානාත්මතා මධ්‍යස්ථානය
UBL Cell- විශ්වවිද්‍යාල ව්‍යාපාර සබැඳි ඒකකය
MIT- කළමනාකරණ තොරතුරු තාක්ෂණය
CQA- තනත්ව සහතිකකරණ මධ්‍යස්ථානය

DR-නියෝජ්‍ය ලේඛකාධිකාරී
DB- නියෝජ්‍ය මූල්‍යාධිකාරී
SAB-ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
SAR- ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
SAIA- ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක
WE- වැඩ ඉංජිනේරු
AR- සහකාර ලේඛකාධිකාරී
AB- සහකාර මූල්‍යාධිකාරී
AIA- සහකාර අභ්‍යන්තර විගණක
CSO- ප්‍රධාන ආරක්ෂක නිළධාරී

SALB- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
ALB- සහකාර පුස්තකාලයාධිපති
AS- සහකාර සංඛ්‍යානඥ

1. විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය

1.1 කෙටි හැඳින්වීම

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය 1995 වසරේ දී ස්ථාපිත කර ඇත. ප්‍රධාන විශ්වවිද්‍යාලය ඔලුවිල් හි වෙරළබඩ තීරයේ ස්ථාපිත කර අති අතර එය අක්කර 178.98 ක පමණ (2011 වර්ෂයේ තක්සේරු වාර්තාව අනුව) තෘණ භූමි භාගයක ව්‍යාප්තව ඇත. විශ්වවිද්‍යාලයේ (ඔලුවිල් පරිශ්‍රයේ) නැගෙනහිර කොටසේ පවතින අඛණ්ඩ මුහුදු බාදනය හේතුවෙන් භූමි ප්‍රමාණයෙන් අක්කර 25.45 ක ප්‍රමාණයක් මේ වන විට විශ්වවිද්‍යාලයට අහිමි වී ඇත. ව්‍යාවහාරික විද්‍යා පීඨය අක්කර 6.72 ක භූමිභාගයක සමන්තුරේ පිහිටා ඇත (2011 වර්ෂයේ තක්සේරු වාර්තාව අනුව). තාක්ෂණික පීඨය යටතේ වූ මල්වත්ත ගොවිපළ (2011 තක්සේරු කිරීම් අනුව,අක්කර 35.25) කෘෂි තාක්ෂණය සඳහා වූ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා යොදා ගනු ලබයි. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල ප්‍රගතියක් විශ්වවිද්‍යාලය විසින් වාර්තා කර ඇත.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සහ විදේශීය රැකියා අවස්ථා සඳහා සරිලන ලෙස උපාධිධාරීන් බිහිකිරීම අරමුණුකොට ගෙන ඊට ගැළපෙන පරිදි උත්කෘෂ්ඨවත් අධ්‍යයන මට්ටමක් පවත්වාගෙන යාමට කටයුතු කරන විශ්වවිද්‍යාලයකි. එසේම සමස්ථ ප්‍රජාවට සහ ඇල්මක් දක්වන පාර්ශ්ව සඳහා අවශ්‍යතාවයට අනුකූල වන පරිදි පහසුකම් සපයමින් බහුවිධ පර්යේෂණ සංස්කෘතියක් විශ්වවිද්‍යාලය තුල වර්ධනය කිරීමට කටයුතු කරමින් සිටියි. මීට අමතරව ප්‍රදේශයේ සාමය සහ සහජීවනය සඳහා ද විශ්වවිද්‍යාලය විශාල දායකත්වයක් සපයයි. වර්තමානයේ විශ්වවිද්‍යාලය සතුව පවතින පීඨ හය තුල අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් **5,843** ක් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින් 447 ක් සිටියි. විශ්වවිද්‍යාලය සතුව ස්ථීර කාර්ය මණ්ඩලය 666 ක් සිටින අතර මේ තුල අධ්‍යයන කාර්ය මණ්ඩලය 199 දෙනෙකු සිටියි.

විශ්වවිද්‍යාලයේ නාමය ජාත්‍යන්තරයේ පිළිගත් විශ්වවිද්‍යාලයක් බවට පත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය එහි විශිෂ්ඨ විද්වතුන් සමඟින් කැප වී සිටී.

1.2 ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන්

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සතුව පීඨ හයක් (06) ඇති අතර ඒවා නම් කලා සහ සංස්කෘතික පීඨය, කළමනාකරණ සහ වාණිජ පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය, ඉංජිනේරු පීඨය සහ තාක්ෂණ පීඨය යන පීඨ වේ. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් මූලික උපාධි සහ පශ්චාත් උපාධි, ඩිප්ලෝමා, සහතික පත්‍ර සහ විවිධ පුහුණු වැඩසටහන් සිදු කරයි.

දේශීය ප්‍රජාවගේ වුවමනාවන් සපුරාලීම සඳහා විශ්වවිද්‍යාලය මගින් දේශීය හා විදේශීය සංවිධාන සමඟ වැඩමුළු පවත්වමින් සහයෝගිව ක්‍රියාකරයි. අධ්‍යයනාංශ, ඒකක සහ පීඨ මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

වගුව 1.1: ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ අධ්‍යයන දෙපාර්තමේන්තු සහ ඒකක පිළිබඳ විස්තර

කලා හා සංස්කෘතික පීඨය
සමාජීය විද්‍යාව
භාෂා
දේශපාලන විද්‍යාව
සමාජ විද්‍යාව
ආර්ථික විද්‍යාව හා සංඛ්‍යානය
භූගෝල විද්‍යාව
ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම්
තොරතුරු තාක්ෂණය
පශ්චාත් උපාධි ඒකකය

කළමනාකරණ හා වාණිජ පීඨය
ගිණුම්කරණ හා මූල්‍ය
කළමනාකරණ
කළමනාකරණ තොරතුරු තාක්ෂණ
අලෙවි කළමනාකරණ
පශ්චාත් උපාධි ඒකකය
ව්‍යවහාරික විද්‍යා පීඨය
ජීව විද්‍යාව
ගණිත විද්‍යාව
භෞතික විද්‍යාව
පරිගණක විද්‍යාව
රසායනික විද්‍යාව
ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා
ඉස්ලාම් අධ්‍යයනය
අරාබි භාෂාව
අන්තර් ක්ෂේත්‍ර පාඨමාලා ඒකකය
ඉංජිනේරු පීඨය
සිවිල් ඉංජිනේරු
යාන්ත්‍රික ඉංජිනේරු
විදුලි සහ ඉලෙක්ට්‍රෝනික් ඉංජිනේරු විද්‍යාව
පරිගණක විද්‍යාව හා ඉංජිනේරු විද්‍යාව
අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයනය
තාක්ෂණ
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
ජෛව පද්ධති තාක්ෂණය

වගුව **1.2:** පීඨ මඟින් ප්‍රදානය කරනු ලබන උපාධි පාඨමාලා (අභ්‍යන්තර)

උපාධි අපේක්ෂක උපාධි පාඨමාලා	SLQF මට්ටම	සාමාන්‍ය/ විශේෂ	කාලසීමාව	මාධ්‍යය
කලා සහ සංස්කෘතික පීඨය				
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	දමිළ
දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	දමිළ / ඉංග්‍රීසි
ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දමිළ / ඉංග්‍රීසි
දර්ශන විද්‍යාව සහ මනෝ උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දමිළ
සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දමිළ / ඉංග්‍රීසි
භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දමිළ / ඉංග්‍රීසි
දෙමළ පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දමිළ
තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT) පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		ඉංග්‍රීසි
දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම (TESL) පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		
හින්දු ශිෂ්ඨාචාරය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දමිළ
ත්‍රිභාෂා අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		ත්‍රෛභාෂා
කළමනාකරණ සහ වාණිජ පීඨය				
ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ	අවුරුදු 4	දමිළ / ඉංග්‍රීසි
වාණිජවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ		ඉංග්‍රීසි
කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය	5	විශේෂ	අවුරුදු 3	
ගිණුම්කරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	6	විශේෂ		
අලෙවි කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	6	විශේෂ		
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	6	විශේෂ		
තොරතුරු පද්ධති පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	6	විශේෂ		

උපාධි අපේක්ෂක පාඨමාලා	SLQF මට්ටම	සාමාන්‍ය/ විශේෂ	කාලසීමාව	මාධ්‍යය
ව්‍යවහාරික විද්‍යා පීඨය				
විද්‍යාවේදී උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	ඉංග්‍රීසි
ව්‍යවහාරික ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
උද්භිද විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
ගණිතය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	අවුරුදු 4	
ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා පීඨය				
ශාස්ත්‍රවේදී උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	දමිළ
ඉස්ලාමීය චින්තනය සහ ශිෂ්ඨාචාරය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ	අවුරුදු 4	දමිළ
ඉස්ලාමීය බැංකුකරණය සහ මූල්‍ය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ		ඉංග්‍රීසි
ඉස්ලාමීය නීතිය සහ නීති සම්පාදනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ		දමිළ
අරාබි භාෂාව සහ සාහිත්‍යය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ		අරාබි සහ දමිළ
වාග් විද්‍යාව හා පරිවර්තනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ		අරාබි, ඉංග්‍රීසි සහ දමිළ
දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය (කලා හා සංස්කෘතික පීඨය සමග සහයෝගී වැඩසටහනක් ලෙස)	6	විශේෂ		ඉංග්‍රීසි
ඉංජිනේරු පීඨය				
විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය (සිවිල් ඉංජිනේරු)	7	විශේෂ	අවුරුදු 4	ඉංග්‍රීසි
විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය (විදුලි සහ විදුලි සංදේශ ඉංජිනේරු)				
විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය (යාන්ත්‍රික ඉංජිනේරු)				
තාක්ෂණ පීඨය				
කෘෂි තාක්ෂණය පිළිබඳ ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය	6	විශේෂ	අවුරුදු 4	ඉංග්‍රීසි
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය	6	විශේෂ		ඉංග්‍රීසි

1.3 වගුව: සහතිකපත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලා (බාහිර)

සහතික පත්‍ර මට්ටමේ පාඨමාලා			
පාඨමාලාවේ නම	SLQF මට්ටම	කාලසීමාව	මාධ්‍යය
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍රය	-	මාස 06	ඉංග්‍රීසි
ඩිප්ලෝමා පාඨමාලා (පශ්චාත් උපාධි නොවන)			
පාඨමාලාවේ නම	SLQF මට්ටම	කාලසීමාව	මාධ්‍යය
උපදේශනය පිළිබඳ වෘත්තීමය ඩිප්ලෝමාව	3	මාස 18	දමිළ
ඉංග්‍රීසි ඩිප්ලෝමාව	1	වසර 1	
ජනමාධ්‍යවේදී ඩිප්ලෝමාව	3	වසර 1	දමිළ

1.4 වගුව: මූලික උපාධි පාඨමාලා (බාහිර)

මූලික උපාධි පාඨමාලා (බාහිර)				
පාඨමාලාවේ නම	SLQF මට්ටම	විශේෂ/සාමාන්‍ය	කාලසීමාව	මාධ්‍යය
කලා හා සංස්කෘතික පීඨය				
ශාස්ත්‍රවේදී උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	දෙමළ
කළමනාකරණ හා වාණිජ පීඨය				
ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	දමිළ
වාණිජවේදී උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	

1.3 පශ්චාත් උපාධි අධ්‍යයන

කලා හා සංස්කෘතික පීඨය, කළමනාකරණ හා වාණිජ පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය සහ තාක්ෂණ පීඨය විසින් පශ්චාත් උපාධි වැඩසටහන් පිරිනමනු ලබයි. (1.5 වගුව). 2021 වර්ෂයේදී විශ්වවිද්‍යාලය විසින් දර්ශණපති උපාධිධාරීන් 01 ක් (දමිළ දර්ශණපති උපාධිය), ව්‍යාපාර පරිපාලනපති උපාධිදාරීන් 16 ක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන් 02 ක් බිහි කරන ලදී.

1.5වගුව: පශ්චාත් උපාධි පාඨමාලා

පීඨය	පශ්චාත් උපාධි පාඨමාලාව	SLQF මට්ටම	පූර්ණ/අර්ධ කාලීන	කාලසීමාව	මාධ්‍යය
කලා හා සංස්කෘතික පීඨය					
දෙමළ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව		8	අර්ධ	අවුරුදු 01	දමිළ
දෙමළ ශාස්ත්‍රපති උපාධිය		10	අර්ධ	අවුරුදු 02	
දෙමළ දර්ශණ		11	අර්ධ/පූර්ණ	අවුරුදු 02	
භූගෝල විද්‍යාව දර්ශණවේදී උපාධිය		11	අර්ධ/පූර්ණ	අවුරුදු 02	දමිළ/ඉංග්‍රීසි
දර්ශන විද්‍යාව දර්ශණවේදී උපාධිය		11	අර්ධ/පූර්ණ	අවුරුදු 02	
දේශපාලන විද්‍යාව දර්ශණවේදී උපාධිය		11	අර්ධ/පූර්ණ	අවුරුදු 02	
සමාජ විද්‍යා දර්ශණවේදී උපාධිය		11	අර්ධ/පූර්ණ	අවුරුදු 02	
දෙමළ ආචාර්ය උපාධිය		12	අර්ධ/පූර්ණ	අවුරුදු 03	දමිළ
භූගෝල විද්‍යාව ආචාර්ය උපාධිය		12	අර්ධ/පූර්ණ	අවුරුදු 03	දමිළ/ඉංග්‍රීසි
දර්ශන විද්‍යාව ආචාර්ය උපාධිය		12	අර්ධ/පූර්ණ	අවුරුදු 03	
දේශපාලන විද්‍යාව ආචාර්ය උපාධිය		12	අර්ධ/පූර්ණ	අවුරුදු 03	
සමාජ විද්‍යා ආචාර්ය උපාධිය		12	අර්ධ/පූර්ණ	අවුරුදු 03	
කළමනාකරණ හා වාණිජ පීඨය					
කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDM)		8	පූර්ණ	අවුරුදු 01	ඉංග්‍රීසි
ව්‍යාපාර පරිපාලනපති උපාධිය (MBA)		10	පූර්ණ	අවුරුදු 02	
ව්‍යවහාරික විද්‍යා පීඨය					
ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව		8	අර්ධ	අවුරුදු 01	ඉංග්‍රීසි
භෞතික විද්‍යාව සහ පෘථිවි විද්‍යාව පිළිබඳ දර්ශණපති උපාධිය		11	පූර්ණ කාලීන අර්ධ කාලීන	මාස 24 මාස 36	
පරිගණක විද්‍යාව පිළිබඳ දර්ශණවේදී උපාධිය					
උද්භිද විද්‍යාව සහ සත්ව විද්‍යාව පිළිබඳ දර්ශණපති උපාධිය					
රසායන විද්‍යා දර්ශණපති උපාධිය					
ගණිතය සහ ව්‍යවහාරික සංඛ්‍යානය දර්ශණපති උපාධිය					
භෞතික විද්‍යාව සහ පෘථිවි විද්‍යාව පිළිබඳ දර්ශණසූරි උපාධිය		12	පූර්ණ කාලීන අර්ධ කාලීන	මාස 36 මාස 54	
පරිගණක විද්‍යා දර්ශණසූරි උපාධිය					
උද්භිද විද්‍යා සහ සත්ව විද්‍යා දර්ශණසූරි උපාධිය					
රසායන විද්‍යා දර්ශණසූරි උපාධිය					
ගණිතය සහ ව්‍යවහාරික සංඛ්‍යානය දර්ශණසූරි උපාධිය					
ඉස්ලාම් අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය					
ඉස්ලාම් අධ්‍යයනය පිළිබඳ පර්යේෂණ දර්ශනපති උපාධිය		11	පූර්ණ	මාස 24	දමිළ
ඉස්ලාම් අධ්‍යයනය පිළිබඳ පර්යේෂණ දර්ශනසූරි උපාධිය		12	පූර්ණ	මාස 36	දමිළ
තාක්ෂණ පීඨය					
ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ පර්යේෂණ දර්ශනපති උපාධිය		11	පූර්ණ/අර්ධ	අවුරුදු 03 අවුරුදු 02	ඉංග්‍රීසි

1.4 ලෝක ශ්‍රේණිගත කිරීම්

වෙබ් දර්ශක ශ්‍රේණිගත කිරීම් අනුව **2022** ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය **7941** වන ස්ථානයේ සිටී. අධ්‍යාපන ආයතන වඩා හොඳ සේවාවක් ලබා දීමට දැඩි උත්සාහයක් දරනා ඉතා තරඟකාරී ලොවක ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය ලෝක ශ්‍රේණිගත කිරීම් තුල පවතින ස්ථානයෙන් ඉහල යාම සඳහා අවශ්‍ය වැඩි දියුණු කිරීම් සිදුකිරීමට පියවර ගෙන තිබේ.

1.5 ශිෂ්‍ය ප්‍රජාව

2021 දෙසැම්බර් වන විට ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ජනගහනය **5843** කි. එක් එක් පීඨය අතර සිසුන්ගේ සමානුපාතික ව්‍යාප්තිය 1.6 වගුවෙහි දැක්වේ.

1.6 වගුව: 2021 දෙසැම්බර් **31** වන විට පීඨ අනුව ශිෂ්‍ය ව්‍යාප්තිය

පීඨය	ශිෂ්‍ය සංඛ්‍යාව	ප්‍රතිශතය (%)
කලා හා සංස්කෘතික	1258	22
කළමනාකරණ හා වාණිජ	1401	24
ව්‍යවහාරික විද්‍යා	742	13
ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා	1308	22
ඉංජිනේරු	479	8
තාක්ෂණ	655	11

පීඨය සහ වර්ෂය අනුව ශිෂ්‍ය ප්‍රජාව රූප සටහන 1.1 හි දැක්වේ



රූපසටහන 1.1: ශිෂ්‍ය ප්‍රජාව

1.6 සේවක ප්‍රජාව

2021 දෙසැම්බර් වන විට ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ සේවක ප්‍රජාව (ස්ථිර කාර්ය මණ්ඩලය) **666** කි. කාණ්ඩය අනුව සේවකයින්ගේ සමානුපාතික ව්‍යාප්තිය රූප සටහන **1.2** හි දැක්වේ.



1.2 රූප සටහන: **2021** දෙසැම්බර් වන විට සේවක ප්‍රජාවේ (ස්ථිර කාර්ය මණ්ඩලය) සමානුපාතික ව්‍යාප්තිය

1.7 අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ව්‍යාප්තිය

තනතුර සහ අධ්‍යාපන මට්ටම අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ (පුස්තකාල කාර්ය මණ්ඩලය හැර) විභිදීම රූප සටහන **1.3** හා **1.4** මඟින් පෙන්නුම් කරයි.



1.3: රූපසටහන
2021 දෙසැම්බර් **31** දිනට තනතුර අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ (පුස්තකාල කාර්ය මණ්ඩලය හැර) විභිදීම



1.4 රූපසටහන: 2021 දෙසැම්බර් 31 දිනට තනතුර අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ (පුස්තකාල කාර්ය මණ්ඩලය හැර) විභිදීම

1.8 ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයීය පුස්තකාල

ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ (SEUSL) පුස්තකාල යනු ප්‍රධාන පුස්තකාලය, ව්‍යවහාරික විද්‍යා පුස්තකාලය සහ විශ්වවිද්‍යාල සංස්කෘතික කෞතුකාගාරය ඇතුළත් පුස්තකාල සහ කෞතුකාගාර ජාලයකි. SEUSL පුස්තකාලය උපායමාර්ගිකව ක්‍රියා කරන අතර තත්ත්ව සහතිකය සඳහා ජාත්‍යන්තර හොඳම භාවිතයන් වෙත යොමු කරයි. 2021 දී පුස්තකාලයේ ප්‍රධාන ජයග්‍රහණ වූයේ:

i) *විශ්වවිද්‍යාල ලේඛනාගාරය:* **2021** SEUSL හි ආරම්භක දිනය සැමරීම සහ රිදී ජුබිලිය නිමිත්තෙන් 2021.10.23 දින SEUSL හි ප්‍රධාන පුස්තකාලයේදී විශ්වවිද්‍යාලයට අදාළ දුර්ලභ ද්‍රව්‍ය සහ බුද්ධිමය ලේඛන සංරක්ෂණය කිරීම සහ බෙදා හැරීමේ අරමුණින් විශ්වවිද්‍යාල ලේඛනාගාරය පිහිටුවන ලදී.

ii) *සහයෝගීතාව ශක්තිමත් කිරීම:* පර්යේෂණ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන්, රචනා සොරාගැනීම් හඳුනාගැනීමේ සේවා, සාහිත්‍ය සෙවීම් සහ ලේඛන බෙදා හැරීමේ සේවා ආදිය පැවැත්වීම මගින් පීඨ සහ සිසුන් සමඟ සම්බන්ධ වීම ශක්තිමත් කිරීම සහ පර්යේෂණ සඳහා පුස්තකාල විද්වතුන්ගේ වැඩි දායකත්වය ප්‍රවර්ධනය කිරීම.

iii) ***Dspace වැඩිදියුණු කිරීම:*** විශ්වවිද්‍යාලයේ රිදී ජුබිලි සැමරුම සැමරීම සඳහා, 2021.10.23 දින Dspace හි නවතම වැඩිදියුණු කළ ඩිජිටල් පුස්තකාල මෘදුකාංග අනුවාදය - **6.3** දියත් කරන ලදී.

iv) ***ILMS වැඩිදියුණු කිරීම:*** විශ්වවිද්‍යාලයේ රිදී ජුබිලිය සැමරීම සඳහා, KOHA ILMS හි නවතම වැඩිදියුණු කළ ඒකාබද්ධ පුස්තකාල කළමනාකරණ පද්ධති මෘදුකාංග අනුවාදය - 21.05 දියත් කිරීම 2021 ඔක්තෝබර් 23 දින සිදු කරන ලදී.

v) ***සමාජ ව්‍යාප්ති වැඩසටහන් :*** ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයීය පුස්තකාලය, ඕස්ට්‍රේලියාවේ YM Trust සමඟ සහයෝගීව, පරිශීලක ප්‍රජාවගේ ප්‍රයෝජනය සඳහා පුස්තකාල පොත් එකතුව ශක්තිමත් කිරීම වෙනුවෙන් කලාපයේ තෝරාගත් පුස්තකාල **10**ක් සඳහා පොත් පරිත්‍යාග කරන ලදී. මෙය ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ආරම්භක දිනය සහ රිදී ජුබිලිය නිමිත්තෙන් අග්නිදිග කලාපයේ පුස්තකාල වැඩිදියුණු කිරීම සඳහා පවත්වනු ලැබූ ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ පුස්තකාල ව්‍යාප්ති වැඩසටහනකි. මෙම වැඩසටහන **2021.10.23** දින ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ආරම්භක දිනය සහ රිදී ජුබිලි සැමරුම් උත්සවයේ කොටසක් ලෙස පවත්වන ලදී.

vi) ***සම්මන්ත්‍රණ කාමරය:*** **2021** නොවැම්බර් **3** වන දින, උපකුලපති මහාචාර්ය ඒ.රමීස් විසින් ප්‍රධාන පුස්තකාලයේ සම්මන්ත්‍රණ කාමරය විවෘත කිරීම ප්‍රකාශයට පත් කරන ලදී. මෙම අවස්ථාව සිහිපත් කිරීම සඳහා, "නැගී එන අභියෝග සහ වැඩිදියුණු කළ අන්තර්ජාල පරිශීලක සේවා සඳහා ඇති අවස්ථා ආමන්ත්‍රණය කිරීමේදී විශ්වවිද්‍යාල පුස්තකාලවල නව භූමිකාවන්" පිළිබඳ Zoom දේශනයක් සංවිධානය කරන ලදී.

vii) ***විශිෂ්ඨ දේශන මාලාව :*** ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ රිදී ජුබිලිය නිමිත්තෙන් ශ්‍රී.අ.වි.වි. පුස්තකාලය විසින් වර්ෂය තුල සම්භාවනීය දේශන මාලාවක් සංවිධානය කරන ලදී.

01. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ පුස්තකාලය විසින් එහි සමාරම්භක දේශන මාලාව 2021 මාර්තු 18 වන දින Zoom හරහා පවත්වන ලදී. ඉන්දියාවේ කල්කටාවේ කල්කටා විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන, ජනමාධ්‍ය හා පුස්තකාල විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය (ආචාර්ය) ස්වප්නා බැනර්ජී ප්‍රධාන කථිකයා

ලෙස සහභාගී වූ අතර "LIS න්‍යාය සහ භාවිතයන් අතර පරතරය පියවීම" යන මැයෙන් දේශනයක් පවත්වන ලදී.

02. "නැගී එන අභියෝග සහ වැඩිදියුණු කළ අන්තර්ජාල පරිශීලක සේවා සඳහා ඇති අවස්ථා ආමන්ත්‍රණය කිරීමේදී විශ්වවිද්‍යාල පුස්තකාලවල නව භූමිකාවන්" යන මාතෘකාව යටතේ දෙවන දේශනය **2021** නොවැම්බර් **3** වන දින Zoom හරහා පැවැත්විණි. ප්‍රධාන කථිකයා වූයේ ඉන්දියාවේ කල්කටාවේ කල්කටා විශ්වවිද්‍යාලයේ LIS අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන මහාචාර්ය (ආචාර්ය) සුස්මිතා චක්‍රබෝර්ති.

viii) *වෘත්තීය අභිවෘද්ධිය සහ පුහුණු මාලා :*

ශ්‍රී.ල.අ.වි. යේ පුස්තකාලය විසින් පුස්තකාල සහ තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ දෙමළ කතා කරන පුස්තකාලයාධිපතිවරුන් දැනුවත් කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා වෘත්තීය උසස්වීම් සහ පුහුණු මාලාවක් සංවිධානය කරන ලදී.

01. "දමිළ ග්‍රන්ථ නාමාවලිය සඳහා යන්ත්‍රයෙන් කියවිය හැකි නාමකරණය" යන මාතෘකාව යටතේ පළමු වැඩසටහන **2021** පෙබරවාරි **22** වැනි දින පැවැත්විණි. යාපනය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති එස්. කේතීස්වරන් මහතා සම්පත් දායකයා ලෙස කටයුතු කළේය.

02. "ශාස්ත්‍රීය පුස්තකාලවල අරාබි සහ ඉස්ලාමීය දැනුම සංවිධානය කිරීම"යන මැයෙන් දෙවන වැඩසටහන **2021** මාර්තු **4** දින පැවැත්විණි. බහරේන්හි කිංඩම් විශ්වවිද්‍යාලයේ පුස්තකාල ප්‍රධානී අශ් - ෂෙයික් එස්.එම්.අසාහිම් මහතා සම්පත් දායකයා ලෙස කටයුතු කළේය.

ix) *නාමාවලි සංස්කරණය පිළිබඳ පුහුණු සැසිය:*

පුස්තකාල විද්වතුන් සහ පරිවෘත්තිකයන් සඳහා පුස්තකාල ග්‍රන්ථ නාම ලේඛන දත්ත ගබඩාව සංස්කරණය කිරීම සඳහා සාමූහික සාකච්ඡාවක් සහ පුහුණු සැසියක් **2021** පෙබරවාරි **2** සහ **3** යන දිනවල පැවැත්විණි.

x) *පොත් ප්‍රදර්ශනය:* ශ්‍රී.ල.අ.වි. යේ පුස්තකාලය විසින් ශ්‍රී.ල.අ.වි. යේ රිදී ජුබිලි වර්ෂයේදී විශ්වවිද්‍යාල ලේඛනාගාරයේ සමාරම්භය සනිටුහන් කරමින් 2021/10/23

දින "එකම ජනතාවක්, එක් ජාතියක් සහ එකම ශ්‍රී ලංකාවක්" යන තේමාව යටතේ පොත් ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලදී.

xi) *ආයතනික සුරක්ෂිතාගාරය වැඩිදියුණු කිරීම:* ඩිජිටල්කරණ වැඩසටහන කළමනාකරණය කිරීම සහ විද්වත් බෙදා හැරීමට පහසුකම් සපයන ආයතනික සුරක්ෂිතාගාරයෙහි (DSpace) ශ්‍රී.ල.අ.වි හි බුද්ධිමය ප්‍රාග්ධනය සංරක්ෂණය කිරීම, ආයතනයේ අධ්‍යයන කටයුතු වල සම්පූර්ණ පළල ප්‍රදර්ශනය කිරීම සහ විශ්වවිද්‍යාලයේ වෙබ්මිතික ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීම. විශ්වවිද්‍යාලයේ ඩිජිටල් සුරක්ෂිතාගාර මෘදුකාංගය 2021 වසරේ 5.5 අනුවාදයේ සිට 6.3 අනුවාදය දක්වා ඉහළ දමන ලදී. අපගේ විද්‍යුත් ගබඩාවේ 2021 දෙසැම්බර් 31 වන විට විද්වත් ලිපි 4,476ක් සංරක්ෂණය කර තිබූ අතර ඉන් 252ක් 2021 තුළ උඩුගත කරන ලදී. විදේශ රටවල නරඹන්නන් ඇතුළු විද්වත් ලිපි සඳහා නැරඹුම් **64,198** ක් ලැබී ඇත.

xii) උපදේශනාත්මක සේවා: පීඨ සහරා, වාර්තාවන් සහ විශ්වවිද්‍යාල ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම සඳහා විශ්වවිද්‍යාලයට උපදේශන උපදෙස් සහ කතුවැකි සහාය ලබා දී ඇත.

xiii) *ඉගෙනුම් සහ ඇගයීම්:*

a. අග්නිදිග විශ්වවිද්‍යාලයේ පුස්තකාලවල සියලුම විද්වතුන්, උපාධි අපේක්ෂකයින් වෙත "තොරතුරු සාක්ෂරතා වැඩසටහන්" පිළිබඳ දේශන පැවැත්වීමට සහ වෛකල්පිත සම්මාන පාඨමාලා ඇගයීමට සහභාගී විය.

b. AEE 31012-පර්යේෂණ ක්‍රම පිළිබඳව ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ පෙව පද්ධති තාක්ෂණ උපාධියේ 3 වන වසරේ සිසුන්ට දේශන පවත්වන ලදී.

c. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන "පුස්තකාල හා තොරතුරු සේවා පිළිබඳ ඩිප්ලෝමාව" සඳහා දේශන පැවැත්වීම.

xiv) *විශ්වවිද්‍යාලයෙන් පිටත පුස්තකාල සේවා:* කොවිඩ් **19** පැතිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලය වසා දමා තිබියදී අපගේ පාර්ශ්වකරුවන්ට දුරස්ථව පුස්තකාල ඉගෙනුම් සම්පත් වෙත ප්‍රවේශ වීමට හැකි වන පරිදි මණ්ඩපයෙන් පිටත පුස්තකාල සේවා සැපයීම සඳහා සිසුන් ඇතුළු ප්‍රධාන විශ්වවිද්‍යාල පාර්ශවකරුවන් සමඟ සාමූහිකව සහ නිර්මාණාත්මකව කටයුතු කරන ලදී.

xv) *විද්‍යුත් දත්ත ගබඩාව:* කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් විශ්වවිද්‍යාලය වසා දමා තිබූ කාලයේදී මෙන්ම නැවත ආරම්භ කිරීමේදීත් ශිබොලෙත් (Shibboleth) ප්‍රවේශය භාවිතා කිරීමෙන් එමරල්ඩ් (EMERALD), ටේලර් සහ ෆ්‍රැන්සිස් (TAYLOR & FRANCIS) සහ ඔක්ස්ෆර්ඩ් (OXFORD) වැනි විද්‍යුත් දත්ත පද්ධති සඳහා දුරස්ථ ප්‍රවේශ පහසුකම් සපයන ලදී. භාවිත සංඛ්‍යාලේඛන අනුව ටේලර් සහ ෆ්‍රැන්සිස් **1,637**ක් එමරල්ඩ් **3,206** ක් සහ ඔක්ස්ෆර්ඩ් **220** ක් වන අතර **2021** වර්ෂය තුළ අපගේ අනුග්‍රාහකයින් විසින් සම්පූර්ණ පෙළ ලිපි **5,063**ක් බාගත කර ඇත.

xvi) *නව අත්පත්කර ගැනීම්:* සියළු පීඨයන්හි අවශ්‍යතා සඳහා **2021** වසර තුලදී පුස්තකාලය විසින් රු.**104,733.00** වටිනාකමින් යුත් මුද්‍රිත පොත් **354** ක් පමණක් මිලදී ගෙන ඇත.

xvii) *රටා සහ නව බඳවා ගැනීම්:* **2021** දෙසැම්බර් 31 වන දිනට ලියාපදිංචි පරිශීලකයින් **3,485** ක් වාර්තා වී ඇති අතර ඔවුන් අතරින් සමාලෝචිත වර්ෂය තුළ නවක සිසුන් **1,644** ක් පුස්තකාල සාමාජිකයින් ලෙස බඳවා ගන්නා ලදී.

xviii) *සංසරණය:* සංසරණය සඳහා වසංගත තත්ත්වය සැලකිය යුතු ලෙස බලපාන ලදී. පුස්තකාල කළමනාකරණ පද්ධතියේ වාර්තා වී ඇති පරිදි පිරික්සුම් ඇතුලත්වීම් **5,438** ක් සහ පිරික්සුම් පිටවීම් **5,502**ක් (මුළු පිරික්සුම් ඇතුලත්වීම්/ පිරික්සුම් පිටවීම් **10,940** ක්) තිබුණි.

xix) *දඩ:* 2021 වර්ෂය තුළ ප්‍රධාන පුස්තකාලයේ සිසුන්ගෙන් රුපියල් 18,050.00 ක් සහ විද්‍යා පුස්තකාලයෙන් රුපියල් 670.00 ක් කල් ඉකුත් වූ දඩ වශයෙන් අය කර ගන්නා ලදී.

xx) *ලේඛන බෙදා හැරීමේ සේවා:* ශ්‍රී.ල.අ.වි.යේ පුස්තකාල විද්‍යුත් පොත් බෙදා හැරීමේ සේවා සපයයි. 2021 දී ඉල්ලීම් 321ක් සිදු කරන ලද අතර ඉන් ඉල්ලීම් 211ක් සපුරාලන ලදී.

xxi) "ටර්නිටින්" ආරම්භක සම්මන්ත්‍රණ

" ටර්නිටින් " වදන් ගැලපීමේ මෘදුකාංගය හඳුන්වාදීම සහ ප්‍රදර්ශනය කිරීම සඳහා වූ ආරම්භක සම්මන්ත්‍රණ පුස්තකාලය මගින් පීඨ අනුව පවත්වන ලදී.

xxii) "ටර්නිටින්" පිලිබඳ මාර්ගගත පුහුණු සැසිය

ටර්නිටින් ප්‍රතිපෝෂණ චිත්‍රාගාරය පිළිබඳ මාර්ගගත පුහුණු සැසිය 28/04/2021 දින පැවැත්විණි. ටර්නිටින් හි පූර්ණ බොෂ් මහත්මිය සම්පත් දායකයා ලෙස සහභාගී විය. ශ්‍රී.අ.වි.වි.යේ පුස්තකාලයාධිපතිවරුන් සහ අප විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය මෙම පුහුණු සැසියට සහභාගී විය.

1.9 ජයග්‍රහණ සහ පිළිගැනීම්:

- ශාස්ත්‍රවේදී ඉතිහාසය (ගෞරව)" පිළිබඳ නව උපාධි වැඩසටහනක් ආරම්භ කිරීමේ යෝජනාව කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

- 2021.03.03 දින අංක 2217/25 දරන ගැසට් නිවේදනය මගින් පීඨයේ පරිගණක ඒකකය 2021.03.03 දින තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ලෙස උසස් කරන ලදී.

- බාහිර උපාධි සහ වෘත්තීය ඉගෙනුම් සඳහා වූ මධ්‍යස්ථානය හරහා ශාස්ත්‍රවේදී බාහිර උපාධි වැඩසටහන පැවැත්වීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

- බාහිර උපාධි සහ වෘත්තීය ඉගෙනුම් සඳහා වූ මධ්‍යස්ථානයේ වැඩසටහන් සමාලෝචනය (ශාස්ත්‍රවේදී බාහිර උපාධි වැඩසටහන) සඳහා ස්වයං ඇගයීම් වාර්තාව (SER) ඉදිරිපත් කරන ලදී.

- දෙමළ / භූගෝල විද්‍යාව / දර්ශනය / දේශපාලන විද්‍යාව / සමාජ විද්‍යාව යන ක්ෂේත්‍රවල දර්ශණපති/දර්ශණසූරී පර්යේෂණ වැඩසටහන් ආරම්භ කරන ලදී.

- 2021 UI ග්‍රීන් මෙට්‍රික් ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල ලෝකයේ වඩාත්ම හිරසාර විශ්වවිද්‍යාල අතරින් 317 වන ස්ථානය ලබා ගත් අතර ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතර 4 වන ස්ථානය ලබා ගන්නා ලදී.

- කොවිඩ් 19 වසංගත කාලසීමාව මධ්‍යයේ අවසාන අධ්‍යයන වාර විභාග සහ අධ්‍යයන වැඩසටහන් මාර්ගගතව සහ භෞතිකව සාර්ථකව පවත්වන ලදී.

- 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා නව සිසුන් කණ්ඩායම බඳවා ගත් අතර අධ්‍යයන වැඩසටහන් මාර්ගගත ක්‍රමය ඔස්සේ සාර්ථකව පවත්වන ලදී.

- ජාතික ප්‍රතිපත්තියට සමගාමීව උසස් අධ්‍යාපනයට ප්‍රවේශය වැඩි කිරීම මගින් විශ්වවිද්‍යාලයට නව සිසුන් බඳවා ගැනීම පුළුල් කළ හැකි විය (රූප සටහන 1.5).



රූප සටහන 1.5: පසුගිය වසර 25 තුල ශිෂ්‍ය බඳවාගැනීම්

- නේවාසිකාගාර පහසුකම් සැලකිය යුතු ලෙස සංවර්ධනය කර ඇති අතර සුදුසුකම් ඇති සියලුම සිසුන්ට නවාතැන් සපයා ඇත. COVID 19 හේතුවෙන්, මාර්ග ගත ක්‍රමය හරහා සිදු කෙරෙන අතර, මෙමගින් 2020 වසරට සාපේක්ෂව 2021 වසර තුළ නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇති සිසුන් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩු වී ඇත.



රූපසටහන **1.6:** නේවාසිකාගාරයන්හි පදිංචිය **2015 - 2021**

- ජාත්‍යන්තර සහ දේශීය පර්යේෂණ සමූළු හයක් පැවැත්වීමට විශ්වවිද්‍යාලයට හැකි විය.
- 2021 වර්ෂය තුළ සමස්ත විශ්වවිද්‍යාලයට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සුවිශත සහ නිර්දේශිත සඟරාවල පර්යේෂණ ලිපි 126ක් ප්‍රකාශයට පත් කිරීමට හැකි විය.
- 2021 වර්ෂය තුල ප්‍රකාශයට පත්කරන ලද සමස්ත ප්‍රකාශන ගණන **418** කි.
- උසස් තත්ත්වයේ පර්යේෂණ කරගෙන යාමට කාර්ය මණ්ඩල සාමාජිකයින් දිරිමත් කිරීමට සහ උසස් තත්ත්වයේ සඟරාවල ප්‍රකාශයට පත් කිරීම තුලින් ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීමට, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් "උසස් බලපෑම් සහිත ප්‍රකාශන සඳහා සනාතන සභා ගෞරව" නමින් සම්මානයක් **2019** දී හඳුන්වා දෙන ලදී. **2021** දී ප්‍රදානය කරන ලද සනාතන සභා ගෞරව සම්මාන පිළිබඳ විස්තර **1.9** වගුවේ දක්වා ඇත. **1.10** සහ **1.11** වගුව මගින් විශ්වවිද්‍යාලය විසින් ප්‍රකාශයට පත් කරන ලද සඟරා නිකුතු සහ **2021** වර්ෂය තුළ සිදු කරන ලද වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණ පිළිබඳ විස්තර පෙන්වයි.

වගුව **1.7: 2021** වසර සඳහා සනාථන සභා ගෞරව සම්මාන

පීඨය	**2021** දී ඉහළ බලපෑමක් ඇති ප්‍රකාශන සඳහා සනාථන ගෞරව සම්මාන සංඛ්‍යාව				
	208වන සනාතන සභාව **(18.01.2021)**	**209**වන සනාතන සභාව **(17.03.2021)**	**210**වන සනාතන සභාව **(19.05.2021)**	**211**වන සනාතන සභාව **(18.08.2021)**	**212**වන සනාතන සභාව **(17.11.2021)**
කලා හා සංස්කෘතික	11	1	3	3	-
කළ.හා වාණිජ	1	6	2	4	7
ව්‍යව.විද්‍යා	1	1	3		3
ඉස්ලාම් හා අරාබි	3	2	-	1	-
ඉංජිනේරු	1			1	-
තාක්ෂණ	5	3	3	2	5
පුස්තකාලය	1	-	-	-	1
එකතුව	**23**	**13**	**11**	**11**	**16**

වගුව **1.8 :** විශ්වවිද්‍යාලය විසින් **2021** වර්ෂයේදී නිකුත් කරන ලද සඟරා නිකුතු

පීඨය	සඟරා නිකුතු
කලා හා සංස්කෘතික පීඨය	KALAM’ සඟරාව -වෙළුම XIII, නිකුතු (01-04) ,2020 මාර්ගගත ක්‍රමයට නිකුත් කරන ලදී
	KALAM’ සඟරාව -වෙළුම XIV, නිකුතුව (01), 2021
FMC	කළමනාකරණ සඟරාව Vol. XVI නිකුතුව I සහ II
	තොරතුරු පද්ධති සහ තොරතුරු තාක්ෂණ සඟරාව (JISIT) වෙළුම VI නිකුතුව I සහ II
	අලෙවිකරණ සඟරාව වෙළුම VI නිකුතුව I සහ II
	ව්‍යාපාර ආර්ථික විද්‍යා සඟරාව වෙළුම III නිකුතුව I සහ II
FAS	විද්‍යා සඟරාව වෙළුම: 02 අංක: 01
	විද්‍යා සඟරාව වෙළුම: 02 අංක: 02
FT	ශ්‍රී ලංකා තාක්ෂණ සඟරාව (SLJoT) වෙළුම 02. නිකුතුව 01.
	ශ්‍රී ලංකා තාක්ෂණ සඟරාව (SLJoT) වෙළුම 02. විශේෂ නිකුතුව
	ශ්‍රී ලංකා තාක්ෂණ සඟරාව (SLJoT) වෙළුම 02. නිකුතුව 02

වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණ අඛණ්ඩව පවත්වනු ලැබේ

වගුව **1.9:** විශ්ව විද්‍යාලය විසින් පවත්වනු ලබන වාර්ෂික පර්යේෂණ සම්මේලන සහ සම්මන්ත්‍රණ

2021 දී පවත්වන ලද සම්මන්ත්‍රණය/ සම්මේලන	පවත්වනු ලැබුයේ
අග්නිදිග විශ්වවිද්‍යාලයීය 9වන ජාත්‍යන්තර කලා පර්යේෂණ සැසිය (SEUARS 2020)	FAC
10 වන වාර්ෂික විද්‍යා පර්යේෂණ සැසිය– 2021 (ASRS 2021)	FAS
8 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය	FIA
9 වන උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය	
විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICST)	FT
ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ කලාපීය සම්මන්ත්‍රණය	

- ඉගැන්වීම් සහ ඉගෙනුම් අරමුණු සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) භාවිතය සාපේක්ෂ වශයෙන් ඉහළ ගොස් ඇති අතර ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාකාරකම් වලදී ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රගතිය පවත්වා ගැනීමට මුල පිරීම් සිදුවෙමින් පවතී.

- **2021** දෙසැම්බර් අවසානය වන විට අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් **72 (37%)** දෙනෙකු ආචාර්ය උපාධිය සම්පූර්ණ කර ඇත.

- **2021** දෙසැම්බර් අවසානය වන විට මහාචාර්ය තනතුරට උසස් කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව **15** කි.

- ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම පුළුල් ලෙස සම්පූර්ණ කරන ලදී.

- තාක්ෂණ පීඨය 2021 දී විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ සිය පළමු ජාත්‍යන්තර සමුළුව පවත්වන ලදී.

1.10 අසාර්ථකවීම් සහ ඊට හේතු

i. මුහුදු බාදනය විශ්වවිද්‍යාලයේ නැගෙනහිර කොටසේ දිගටම පවතින අතර වර්තමාන ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණයත් සමඟ විශ්වවිද්‍යාලයට මෙම ගැටළුව වළක්වා ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලය විසින් මේ පිළිබඳව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කර ඇති අතර, ගැටලුව වැළැක්වී සඳහා පියවර ගන්නා බවට ඔවුන් පොරොන්දු වී තිබේ.

ii. ගල් ඔය පිටාර ගැලීම හේතුවෙන් විශ්වවිද්‍යාලය වැසි සමයේදී ගංවතුර තර්ජනයට මුහුණ දෙමින් සිටී. ගංවතුර ආරක්ෂණ බැම්ම ස්ථාපිත කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකි විය. මේ පිළිබඳව විශ්වවිද්‍යාලය විසින් අදාල බලධාරීන්ගේ අවධානයට යොමුකලද, එය ක්‍රියාත්මක නොවිණි.

iii. UG හෝ PG වැඩසටහන් සඳහා විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීමට අපොහොසත් වීම. මෙයට හේතුව ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය අගනුවර සිට කිලෝ මීටර් **360** ක් පමණ දුරින් පිහිටීමයි. කොළඹ සිට විශ්වවිද්‍යාලයට බසයෙන් හෝ දුම්රියෙන් ගමන් කිරීමට පැය **9**ක් පමණ ගත වන බැවින් අභයන්තර ප්‍රවාහන මාධ්‍ය මෙහි පැමිණීමට කැමති සිසුන්ගේ අපේක්ෂාවන් සපුරාලන්නේ නැත. අභ්‍යන්තර ගුවන් ගමන් තවදුරටත් ක්‍රියාත්මක නොවේ.

iv. මෙරට සහ විදේශයන්හි සිටින උගතුන් සහ විද්වතුන් ආකර්ෂණය කර ගැනීමට අපොහොසත් වීම. iii හි දක්වා ඇති ආකාරයේ කරුණුම මෙයට හේතු විය හැක.

v. බඳවාගැනීම්:

පහත දැක්වෙන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට තවමත් නොහැකි විය;

- සෞඛ්‍ය මධ්‍යස්ථානය සඳහා ස්ථිර වෛද්‍ය නිළධාරීන් – සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වැඩි වැටුපකට වඩා හොඳ අවස්ථාවන් ඇති බැවින් වෛද්‍යවරුන් විශ්වවිද්‍යාල සේවයට බැඳීමට අයදුම් නොකරයි. කෙසේ වෙතත්, අර්ධ කාලීන පදනමින් පත් කරන ලද වෛද්‍ය නිලධාරීන් සමඟ සෞඛ්‍ය මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ.
- ව්‍යාපෘති කළමනාකරු - අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති ඉංජිනේරුවන් අඩු වැටුපකට විශ්වවිද්‍යාලයට සේවය කිරීමට අකැමැති බැවිනි.

1.11 අනාගත සැලසුම්

- විෂයමාලා සමාලෝචනය සඳහා ස්ථායී හා පුළුල් ප්‍රතිපත්තියක් මගින් දැනුම් දෙන අධ්‍යයන වැඩසටහන් වල විෂයමාලා සංශෝධන සිදු කිරීම.

- රටේ අවශ්‍යතා සපුරාලීම සඳහා නව උපාධි වැඩසටහන් රැසක් පිරිනැමීමට ශ්‍රී.අ.වි.වි පියවර ගෙන ඇත. **1.10** වගුව මඟින් පීඨ විසින් ආරම්භ කිරීමට නියමිත නව උපාධි වැඩසටහන් සහ ඩිප්ලෝමා වල වර්තමාන තත්ත්වය පෙන්වයි.

වගුව **1.10:** ආරම්භ කිරීමට නියමිත නව අධ්‍යයන පාඨමාලා

පීඨය	උපාධි අපේක්ෂක/ පශ්චාද් උපාධි/ සහතිකපත්‍ර/ ඩිප්ලෝමා පාඨමාලා	SLQF මට්ටම	සාමාන්‍ය/ විශේෂ (අදාල නම්)	කාල සීමාව	මාධ්‍ය	වර්තමාන තත්ත්වය
කලා හා සංස්කෘතික	ශාස්ත්‍රවේදී ගෞරව - ඉතිහාසය	6	ගෞරව	අවුරුදු 04	දෙමළ	UGC අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටින අතර 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.
	ශාස්ත්‍රවේදී ගෞරව - සංචාරක	6	ගෞරව	අවුරුදු 04	දෙමළ / ඉංග්‍රීසි	වැඩ කටයුතු සිදු වෙමින් පවතින අතර 2023 දී ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.
ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා	තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව	3	-	අවුරුදු 01	ඉංග්‍රීසි	ක්‍රියාත්මක වෙමින් පවතී
	අරාබි සහතික පත්‍රය	2	-	මාස 06	අරාබි	පාඨමාලා පිළිබඳ යෝජනාව සභාව විසින් අනුමත කරන ලදී.
	අරාබි ඩිප්ලෝමාව	3	-	අවුරුදු 01	අරාබි	
කළමනාකරණ හා වාණිජ	දර්ශනසූරී	12		අවුරුදු 03	ඉංග්‍රීසි	2022 ජනවාරි වන විට ආරම්භ කිරීමට නියමිතය.
	දර්ශනපති	11				
ව්‍යවහාරික විද්‍යා	පරිගණක විද්‍යාගාර තාක්ෂණය පිළිබඳ සහතික පත්‍රය/ ඩිප්ලෝමාව	3	-		ඉංග්‍රීසි	යෝජනාව ආරම්භ කිරීමට නියමිතයි.
	තොරතුරු හා සන්නිවේදන ඩිප්ලෝමාව (DICT)	3	-	අවුරුදු 01		සනාතන සභාව විසින් යෝජනාව CDC/ සනාතන සභාව වෙත යොමු කරන ලදී.
	බහු ක්ෂේත්‍ර පිලිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	ගෞරව	අවුරුදු 04		යෝජනාව ආරම්භ කිරීමට නියමිතයි.
	විද්‍යාවේදී උපාධිය (BSc.) (බාහිර): (ව්‍යවහාරික විද්‍යා පීඨයේ පවතින උපාධි බාහිරව පිරිනැමීම)	5	සාමාන්‍ය	අවුරුදු 03		යෝජනාව ආරම්භ කිරීමට නියමිතයි.
	ව්‍යවහාරික සහ පාරිසරික භූ ගර්භ විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය	6	සාමාන්‍ය	අවුරුදු 04		UGC අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටියි.
	විශ්ලේෂණ / ඖෂධ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (BSc.)	5	ගෞරව	අවුරුදු 04		යෝජනාව ආරම්භ කිරීමට නියමිතයි.
	යුනානි වෛද්‍ය හා ශල්‍ය වෛද්‍යවේදී උපාධිය (BUMS) - ශ්‍රී.අ.වි.වි	6	ගෞරව	අවුරුදු 04		කෙරිගෙන යන තාර්කික සහ ශක යතාඅධ්‍යයනය විශ්ලේෂණය කිරීම.
	පරිසර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය	10	-	අවුරුදු 02	ඉංග්‍රීසි	අන්තර්ගත සංවර්ධනය සහ පාර්ශවකරුවන්ගේ ප්‍රතිපෝෂණ සමීක්ෂණය සිදු වෙමින් පවතී.
කාර්මික	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී	5	සාමාන්‍ය	අවුරුදු 03	ඉංග්‍රීසි	UGC හි සමාලෝචනය යටතේ පවතින අතර 2022 දී ආරම්භ කිරීමට

	උපාධිය.					බලාපොරොත්තු වේ.
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විද්‍යාපති උපාධිය.	10	-	අවුරුදු **02**		යෝජනාව සංවර්ධනය කිරීම සිදු වෙමින් පවතින අතර 2023 දී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

- තාක්ෂණ පීඨයට ISO සහතිකය ලබා ගැනීම.
- වාර්ෂික අරාබි භාෂා දිනය ලබන වසර වන විට ඉස්ලාමීය අධ්‍යයන හා අරාබි භාෂා පීඨය විසින් සමරනු ලැබේ.
- විධිමත් හා සම්මත සමාලෝචනයක් සඳහා සම්මත මෙහෙයුම් ප්‍රතිපත්තියක් විධිමත්කරණය කිරීමට සියළු අධ්‍යයන වැඩසටහන් වල විෂයමාලා උස්ස කිරීම හා සමාලෝචනය කිරීම.
- සියළුම අධ්‍යයන වැඩසටහන් සඳහා විෂයමාලා උපදේශන වැඩසටහන් පැවැත්වීම.
- ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය ප්‍රශස්ත ලෙස ක්‍රියාත්මක කිරීම වැඩිදියුණු කිරීම.
- සමාලෝචනයට භාජනය නොකල අධ්‍යයන වැඩසටහන් තත්ත්ව සහතිකකරණ සමාලෝචනයට භාජනය කිරීම.
- අපගේ පර්යේෂකයින්ගේ බලපෑම වැඩිකිරීමට පියවර ගැනීම.
- සමාජය හා කර්මාන්ත විසින් ඉල්ලා සිටින අධ්‍යයන වැඩසටහන් ආරම්භ කිරීමට පියවර ගැනීම.
- සම-සංවිධාන කාර්යයන් ස්වයංක්‍රීය කිරීම හා ඒකාබද්ධ කිරීම සඳහා පුළුල් ව්‍යවසාය පර්යේෂණ සැලසුම් හඳුන්වා දීම
- විශ්වවිද්‍යාල දින දර්ශනය සහ ප්‍රතිපත්ති රාමුව සම්පාදනය කිරීම.
- සහයෝගී පර්යේෂණ සඳහා වෙනත් ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ නව සම්බන්ධතා සඳහා සුදුසුකම් ලැබීම.
- විශ්වවිද්‍යාලයේ ප්‍රදාන සහ වෙනත් තරඟකාරී ප්‍රදාන සඳහා කාර්ය මණ්ඩලය උත්තේජනය කිරීම.

- **විශ්වවිද්‍යාලයේ ශ්‍රේණිගත කිරීමට බලපෑමක් ඇති කිරීමට රිසර්ච් ගේට්, ගූගල් ස්කොලර්, ඇකඩමියා ආදී ජනප්‍රිය පර්යේෂණ ජාලයන්හි ඔවුන්ගේ පර්යේෂණ ලිපි පල කිරීම් සඳහා කාර්ය මණ්ඩලය උනන්දු කරවීම.**

කැපීපෙනෙන සිදුවීම්

උපකුලපතිවරයා රාජකාරී භාර ගැනීම





ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ රිදී ජුබිලිය සැමරීම





කළමනාකරණ හා වාණිජ පීඨයේ කළමනාකරණ අධ්‍යයනාංශයේ පර්යේෂණ මුල්ල විවෘත කිරීමේ උත්සවය





ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විශ්වවිද්‍යාල ව්‍යාපාර සබැඳියේ තුන්වන අදියර සාර්ථක ලෙස සම්පූර්ණ කරන ලදී.



ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය, සමානාත්මතාවය (GEE) සහ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) පිළිබඳ සවිඥානික බව ඉහළ නැංවීමේ වැඩසටහන: නීතිමය අංශය කෙරෙහි අවධානය යොමු කිරීම.







FAC විසින් සංවිධානය කරන ලද ප්‍රජා සම්බන්ධක වැඩසටහන (පානම සංචාරය) පිළිබඳ කාර්ය මණ්ඩලය සඳහා වූ වැඩමුළුව



ප්‍රතිඵල හරහා සිසුන්ගේ කාර්ය සාධනය මැනීම පිළිබඳ සිසුන් සඳහා වූ වැඩමුළුව

FAC විසින් සංවිධානය කරන ලද ප්‍රජා සම්බන්ධක වැඩසටහන (අලිගම්බේ සංචාරය) පිළිබඳ කාර්ය මණ්ඩලය සඳහා වූ වැඩමුළුව







2. සිසුන් සහ සම්පත් පිළිබඳ විස්තර

2.1. ශිෂය ප්‍රජාව සහ ස්ථිර කාර්ය මණ්ඩලය

2020 වසරේ දෙසැම්බර් සහ **2021** වසරේ දෙසැම්බර් අවසානය වන විට ශිෂ්‍ය ප්‍රජාව හා සියළු කාණ්ඩ වල නිත්‍ය සේවකයින් පිළිබඳ විස්තර පහත **2.1** වගුව මගින් විස්තර කෙරේ.

2.1 වගුව: ශිෂ්‍ය ප්‍රජාව හා නිත්‍ය සේවකයින් පිළිබඳ තොරතුරු

පීඨය/දෙපාර්තමේන්තුව/අංශය/ඒකකය	මුළු සිසුන්		මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය		අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය		පරිපාලන හා වෙනත් විධායක නිළධාරීන්		අනධ්‍යයන හා පරිපාලන නොවන කාර්ය මණ්ඩලය	
	2020	2021	2020	2021	2020	2021	2020	2021	2020	2021
කලා හා සංස්කෘතික පීඨය	1183	1258	45	47	08	09	01	01	420	416
ව්‍යවහාරික විද්‍යා පීඨය	769	742	32	36	02	02	01	01		
කළමනාකරණ හා වාණිජ පීඨය	1277	1401	34	33	02	02	01	01		
ඉස්ලාමීය අධ්‍යයන හා අරාබි භාෂා පීඨය	1274	1308	23	24	01	01	01	01		
ඉංජිනේරු පීඨය	441	479	30	29			02	02		
තාක්ෂණ පීඨය	614	655	19	25			01	01		
පුස්තකාලය			06	05	01	01	01	01		
පොදු පරිපාලනය							24	21		
බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය							01	01		
ශාරීරික අධ්‍යාපන ඒකකය					03	03				
තොරතුරු හා සංඛ්‍යාන ඒකකය					01	01				
වෘත්තිය මාර්ගෝපදේශ ඒකකය					01	01				
ජාල මෙහෙයුම් ඒකකය					01	01				
අනෙකුත් දෙපාර්තමේන්තු										
එකතුව	5,558	5,843	189	199	20	21	33	30	420	416

2.2 දේශීය සිසුන් පිළිබඳ විස්තර

2.2 වගුව: අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහන් වල දේශීය සිසුන් (නවක සිසුන්)

පීඨය	අධ්‍යයන වැඩසටහන	2020 දෙසැම්බර් 31 දිනට				2021 දෙසැම්බර් 31 දිනට			
		බඳවාගැනීමේ වර්ෂය	එකතුවූ බඳවා ගැනීම් ප්‍රමාණය	ලියාපදිංචි වූ ප්‍රමාණය	පාඨමාලාව හදාරන ප්‍රමාණය	බඳවාගැනීමේ වර්ෂය	එකතුවූ බඳවා ගැනීම් ප්‍රමාණය	ලියාපදිංචි වූ ප්‍රමාණය	පාඨමාලාව හදාරන ප්‍රමාණය
කලා හා සංස්කෘතික පීඨය	කලා	2018/2019	350	355	361*	2019/2020	421	384	380
කළමනාකරණ හා වාණිජ පීඨය	කළමනාකරණ	2018/2019	140	124	124	2019/2020	188	183	183
	වාණිජ		120	106	106		152	149	142
	කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණය		120	110	109		170	159	159
ව්‍යවහාරික විද්‍යා පීඨය	භෞතික විද්‍යාව	2018/2019	150	103	103	2019/2020	223	146	136
	ජීව විද්‍යාව		150	125	120		212	161	136
ඉස්ලාමීය අධ්‍යයන හා අරාබි භාෂා පීඨය	අරාබි භාෂාව	2018/2019	200	177	179	2019/2020	225	206	199
	ඉස්ලාම් අධ්‍යයනය		250	217	213		278	268	263
ඉංජිනේරු පීඨය	ඉංජිනේරු	2018/2019	100	81	81	2019/2020	145	130	130
තාක්ෂණ පීඨය	ජෛව පද්ධති තාක්ෂණය	2018/2019	85	82	82	2019/2020	109	105	105
	තොර. හා සන්නි. තාක්ෂණය		75	69	69		100	96	96
එකතුව			**1740**	**1549**	**1547**		**2223**	**1987**	**1929**

* **2017/2018** අධ්‍යයන වර්ෂය කල් දමන ලද සිසුන් **06** ක් **2018/2019** දී සම්බන්ධ විය.

2.3 වගුව: අභ්‍යන්තර මූලික උපාධි පාඨමාලා සඳහා දේශීය සිසුන් ඇතුලත් කර ගැනීම. (මුළු සිසුන් ගණන)

පීඨය	අධ්‍යයන වැඩසටන	අධ්‍යයන වසර	බඳවාගැනීමේ වර්ෂය	වි.වි.ප්‍ර.කොං.ස බඳවාගැනීම් (දේශීය සිසුන්)			බඳවාගැනීමේ වර්ෂය	වි.වි.ප්‍ර.කොං.ස බඳවාගැනීම් (දේශීය සිසුන්)		
				පිරිමි	ගැහැණු	එකතුව		පිරිමි	ගැහැණු	එකතුව
			2020 දෙසැම්බර් 31 දිනට				**2021** දෙසැම්බර් 31 දිනට			
කලා හා සංස්කෘතික පීඨය	කලා	1 වන වසර	2018/2019	48	313	361	2019/2020	37	343	380
	කලා	**2** වන වසර	2017/2018	33	321	354	2018/2019	48	313	361
	කලා	**3** වන වසර	2016/2017	25	299	324	2017/2018	33	321	354
	කලා (විශේෂ)	**4** වන වසර	2015/2016	11	133	144	2016/2017	13	150	163
			උප එකතුව	**117**	**1,066**	**1,183**	**උප එකතුව**	**131**	**1,127**	**1,258**
කළමනාකරණ හා වාණිජ පීඨය	කළමනාකරණ	1 වන වසර	2018/2019	56	69	125	2019/2020	66	117	183
	වාණිජ			27	79	106		50	92	142
	ක.තොං.තා (MIT)			20	88	108		28	131	159
	කළමනාකරණ	**2** වන වසර	2017/2018	39	98	137	2018/2019	56	67	123
	වාණිජ			38	63	101		28	79	107
	ක.තොං.තා (MIT)			19	82	101		20	88	108
	කළමනාකරණ	**3** වන වසර	2016/2017	53	76	129	2017/2018	39	98	137
	වාණිජ			39	76	115		38	63	101
	ක.තොං.තා (MIT)			20	92	112		19	82	101
	කළමනාකරණ	**4** වන වසර	2015/2016	59	75	134	2016/2017	51	76	127
	වාණිජ			33	75	108		38	74	112
			උප එකතුව	**403**	**873**	**1,276**	**උප එකතුව**	**433**	**967**	**1,400**
ව්‍යවහාරික විද්‍යා පීඨය	භෞතික විද්‍යාව	1 වන වසර	2018/2019	44	52	96	2019/2020	73	63	136
	ජීව විද්‍යාව			16	104	120		30	106	136
	භෞතික විද්‍යාව	2 වන වසර	2017/2018	50	51	101	2018/2019	44	51	95
	ජීව විද්‍යාව			21	92	113		14	97	111
	භෞතික විද්‍යාව	3 වන වසර	2016/2017	59	47	106	2017/2018	50	51	101
	ජීව විද්‍යාව			35	99	134		21	91	112
	භෞතික විද්‍යාව	4 වන වසර	2015/2016	27	33	60	2016/2017	5	9	14
	ජීව විද්‍යාව			4	33	37		6	31	37
			උප එකතුව	**256**	**511**	**767**	**උප එකතුව**	**243**	**499**	**742**

පීඨය	අධ්‍යයන වැඩසටහන	අධ්‍යයන වසර	බඳවාගැනීමේ වර්ෂය	වි.වි.ප්‍ර.කොා.ස බඳවාගැනීම් (දේශීය සිසුන්)			බඳවාගැනීමේ වර්ෂය	වි.වි.ප්‍ර.කොා.ස බඳවාගැනීම් (දේශීය සිසුන්)		
				පිරිමි	ගැහැණු	එකතුව		පිරිමි	ගැහැණු	එකතුව
				2020 දෙසැම්බර් 31 දිනට				**2021 දෙසැම්බර් 31 දිනට**		
ඉස්ලා අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය	අරාබි භාෂාව	1 වන වසර	2018/2019	60	119	179	2019/2020	64	135	199
	ඉස්ලාම් අධ්‍යයනය			32	181	213		38	225	263
	අරාබි භාෂාව	2 වන වසර	2017/2018	61	121	182	2018/2019	60	119	179
	ඉස්ලාම් අධ්‍යයනය			35	196	231		32	176	208
	අරාබි භාෂාව	3 වන වසර	2016/2017	60	124	184	2017/2018	61	121	182
	ඉස්ලාම් අධ්‍යයනය			39	199	238		35	196	231
	අරාබි භාෂාව	4 වන වසර	2015/2016	10	12	22	2016/2017	6	10	16
	ඉස්ලාම් අධ්‍යයනය			06	19	25		11	19	30
			උප එකතුව	**303**	**971**	**1,274**	උප එකතුව	**307**	**1,001**	**1,308**
ඉංජිනේරු පීඨය	විද්‍යාවේදී ඉංජිනේරු	1 වන වසර	2018/2019	68	13	81	2019/2020	106	24	130
	විද්‍යාවේදී ඉංජිනේරු	2 වන වසර	2017/2018	73	10	83	2018/2019	68	13	81
	විද්‍යාවේදී ඉංජිනේරු	3 වන වසර	2016/2017	72	16	88	2017/2018	73	10	83
	විද්‍යාවේදී ඉංජිනේරු	4 වන වසර	2015/2016	76	21	97	2016/2017	72	16	88
	විද්‍යාවේදී ඉංජිනේරු	අවසන් වසර	2014/2015	80	12	92	2015/2016	76	21	97
			උප එකතුව	**369**	**72**	**441**	උප එකතුව	**395**	**84**	**479**
තාක්ෂණ පීඨය	ජෛව පද්ධති තාක්ෂණය	1 වන වසර	2018/2019	18	64	82	2019/2020	22	83	105
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය			53	19	72		59	37	96
	ජෛව පද්ධති තාක්ෂණය	2 වන වසර	2017/2018	22	61	83	2018/2019	18	64	82
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය			44	27	71		50	19	69
	ජෛව පද්ධති තාක්ෂණය	3 වන වසර	2016/2017	15	65	80	2017/2018	22	61	83
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය			53	16	69		44	27	71
	ජෛව පද්ධති තාක්ෂණය	4 වන වසර	2015/2016	14	68	82	2016/2017	15	65	80
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය			59	16	75		53	16	69
			උප එකතුව	**278**	**336**	**614**	උප එකතුව	**283**	**372**	**655**
එකතුව				**1726**	**3829**	**5555**	**එකතුව**	**1792**	**4050**	**5842**

2.4 වගුව: ශාස්තු අය කරන බාහිර උපාධි අපේක්ෂක වැඩසටහන් සඳහා බඳවා ගැනීම. (මුළු සිසුන් සංඛ්‍යාව)

අධ්‍යයන වැඩසටහන	අධ්‍යයන වර්ෂය	සිසුන් බඳවා ගැනීම් (මුළු ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව) (2020 දෙසැම්බර් 31 දිනට)			සිසුන් බඳවා ගැනීම් (මුළු ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව) (2021 දෙසැම්බර් 31 දිනට)		
		පිරිමි	ගැහැණු	එකතුව	පිරිමි	ගැහැණු	එකතුව
ශාස්ත්‍රවේදී උපාධිය	1 වන, 2 වන සහ 3 වන වසර	3,628	4,069	**7,697**	3,660	4,152	**7,812**
ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය	1 වන, 2 වන සහ 3 වන වසර	2,401	1,081	**3,482**	2,514	1,176	**3,690**
වාණිජවේදී උපාධිය	1 වන, 2 වන සහ 3 වන වසර	315	274	**589**	354	304	**658**
	එකතුව	**6,344**	**5,424**	**11,768**	**6,528**	**5,632**	**12,160**

2.5 වගුව: පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා දේශීය සිසුන්ගේ නව ඇතුලත්වීම් (2020 ජනවාරි - දෙසැම්බර්) සහ (2021 ජනවාරි - දෙසැම්බර්) කාලය තුල

පීඨයේ නම	අධ්‍යයන වැඩසටහන	පූර්ණ කාලීන/ අර්ධ කාලීන	නව ඇතුලත් වීම් (ජනවාරි - දෙසැම්බර් 2020)			පූර්ණ කාලීන/ අර්ධ කාලීන	නව ඇතුලත් වීම් (ජනවාරි - දෙසැම්බර් 2021)		
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශණය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශණය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශණය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණය, මාගේ විධාන යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය ප්‍රකාරව , 2018 අංක 19 දරණ ජාතික විගණන පනත සහ 1978 විශ්වවිද්‍යාල පනත් අංක 16 හි 107(5) පරිච්ඡේදය මත මාගේ අදහස් හා නිර්දේශයන් විශ්වවිද්‍යාල පනතේ 108(1) පරිච්ඡේදය අනුව වාර්ෂික වාර්තාව මඟින් ප්‍රකාශයට පත්කළ යුතු බව මාගේ අදහසයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව, මාගේ වාර්තාව පාර්ලිමේන්තුව වෙත නියමිත කාල සීමාව තුල ඉදිරිපත් කිරීමට නියමිතය.

මාගේ විගණන මතය අනුව තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා හේතු වන කරුණුකාරණා විස්තර කර ඇති පරිච්ඡේදයට පරිබාහිරව, අනෙකුත් මුල්ය ප්‍රකාශණ සත්‍ය හා සාධාරණ ලෙස 2021 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරන අතර එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව අවසන් වර්ෂය සඳහා පෙන්නුම් කෙරේ.

1.2 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

(a) මෙම වසර සැලකීමේ දී, පෙර වසරෙහි දෝෂ නිවැරදි කිරීම සඳහා රු. **27,979,710** ක අතිරික්තයක් ගලපා ඇති අතර ඒ සඳහා ප්‍රත්‍යාවෙක්ෂණය කිරීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ **03** ප්‍රකාරව කටයුතු කර නොමැත.

(b) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත **07** හි පරිච්ඡේද **65** ප්‍රකාරව, දේපළ පිරියත හා උපකරණ යටතේ පෙන්නුම් කර ඇති සම්පූර්ණයෙන්ම ක්ෂය වීමට ලක් වූ අයිතමයන් නැවත අගය කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොමැත. පිරිවැය රු. **766,109,399** වන සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපළ පිරියත හා උපකරණ තවදුරටත් භාවිතයට ගනු ලබන බව වසර අවසානයේ දී ද නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත **03** ප්‍රකාරව මෙම ඇස්තමේන්තු ගත දෝෂය නිවැරදි කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොමැත.

(c) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත **07** හි පරිච්ඡේද **47** ප්‍රකාරව, වත්කම් සෑම වසර **03**කට හෝ **05**කට වතාවක් නැවත අගය කල යුතු වේ. කෙසේ වුවද, පිරිවැය රු. **450,330,000** වන **2011** දී නැවත අගය කරන ලද ඉඩම් **05**ක් මේ දක්වා එනම් වසර **10**ක් ගත වුවද, නැවත අගය කිරීමට කටයුතු කර නොමැත.

(d) විගණනය සඳහා මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇති පරිදි එහි **2021** වර්ෂයේ දෙසැම්බර් මස **31** වන දිනට ලී බඩු හා උපකරණවල පිරිවැය සඳහන් වනුයේ, රු. **2,158,550,419** ලෙසය. එහෙත් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නිරීක්ෂණය කිරීමේ දී එහි සඳහන් වනුයේ පිරිවැය රු. **1,923,388,792** ලෙසිණි. මෙහි වෙනස වන රු.**235,161,627** සම්බන්දයෙන් විගණනය වෙත තොරතුරු ඉදිරිපත් කර නොමැත .

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට **(SLAuSs)** අනුකූලව මා විසින් විගණන කටයුතු සිදු කරනු ලැබීය. මූල්‍ය කටයුතු වෙනුවෙන් ප්‍රමිතීන් ප්‍රකාරව මාගේ විගණන වගකීම, මාගේ වාර්තාවේ විගණකාධිපතිගේ යන පරිච්ඡේදයේ පැහැදිලි කර ඇත. තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත යන බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයෙහි 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ සඳහන් අනෙකුත් තොරතුරු

2021 වර්ෂයේ වාර්ෂික වාර්තාවෙ හි සඳහන් තොරතුරු අනෙකුත් තොරතුරු තුල අන්තර් ගත කොට ඇත.එහෙත් එහි, විගණන වාර්තාවට ප්‍රථම මා විසින් ලබා ගත් ගිණුම් වාර්තා සහ මාගේ විගණන මතය සහිත වාර්තාවන් ඉදිරිපත් කර නොමැත. කළමණාකරණය විසින් අනෙකුත් තොරතුරු සම්බන්ධව වගකීම දැරිය යුතු වේ.

ගිණුම් වාර්තා පිළිබඳ ව වන මාගේ විගණන මතය තුලින් අනෙකුත් තොරතුරු සම්බන්ධ මතයන් ආවරණය නොවන අතර ඒ සම්බන්දව කිසිදු ප්‍රකාශිත සහතිකයක් ලබා දෙනු නොලැබේ.

ගිණුම් වාර්තා සමඟ මාගේ විගණනයන් පිළිබඳව මාගේ වගකීම වනුයේ, ඉහත හඳුනා ගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ සිදු කිරීමේ දී මාගේ විගණන කටයුතු සම්බන්ධව ලබා ගත් දැනුම මත අනෙකුත් තොරතුරු ගිණුම් ප්‍රකාශණ සමඟ ප්‍රමාණාත්මක නොවන විට දී හෝ නොඑසේ නම් ප්‍රමාණාත්මක ලෙස වැරදි අයුරින් ප්‍රකාශ කර ඇත්නම් පමණි.

මෙම විගණන වාර්තාව ලබා ගැනීමට ප්‍රථම මා විසින් මෙහි අනෙකුත් තොරතුරු යන පරිච්ඡේදය පරිශීලනය කල විට හා මෙම අනෙකුත් තොරතුරු තුල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ අන්තර්ගත වන්නේ නම්, ඒ බව මා විසින් මෙහි සඳහන් කරනු ලබන අතර එලෙස සඳහන් කල යුතු වේ. මෙහි දී, මා හට මේ සම්බන්ධව කිසිවක් වාර්තා කිරීමට නොමැත.

1.4 මූල්‍ය ප්‍රකාශණ සඳහා කළමනාකරණයේ සහ රාජ්‍යය පාලන අධිකාරියේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව සත්‍ය හා සාධාරණ මතයක් ඉදිරිපත්වන අයුරින්, මූල්‍ය ප්‍රකාශණ පිළියල කිරීම කළමණාකරණයේ වගකීම් වන අතර, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ද කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමේ දී විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීම්, හෙළි දරව් කිරීම්, උචිත තත්ත්වයන්, අඛණ්ඩ පැවැත්ම සඳහා බලපාන තත්ත්වයන් සහ ගිණුම්කරණ කටයුතු අඛණ්ඩ පැවැත්ම මත පදනම් ව සිදුකිරීම ආදිය තහවුරු කර ගැනීම කළමනාකරණයේ වගකීම වේ. එනම්, කළමණාකරනයේ අභිමතය විශ්වවිද්‍යාලයේ කටයුතු ඇවර කිරීම හෝ විශ්වවිද්‍යාල කටයුතු නවතාලීම නොවන්නේ නම්, මීට පරිබාහිරව කිසිදු තාත්වික විකල්පයක් නොමැති අතර එය එලෙස සිදු කළ යුතු වේ. මූල්‍ය ප්‍රකාශණ වාර්තාකරණය පිළිබඳ ව රාජ්‍යය පාලන අධිකාරිය වගකීමට යටත් වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) පරිච්ඡේදය ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳව නිසියාකාරව වාර්තාවන් පොත් තැබීම සිදුකළ යුතු අතර මෙමඟින් විශ්වවිද්‍යාලයේ වාර්ෂික හා ආවර්තිත මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීම සඳහා උපකාරී වේ.

1.5 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම උදෙසා විගණකවරුන්ගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්, එනම් වැරදි හා වංචාවලින් තොර ද යන්න මත විගණන මතයන් විගණන වාර්තාව තුලින් එළි දැක්වීම හා එමඟින් සාධාරණ සහතික වීමක් ලබාදීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීමක් යන්න ඉතා උසස් සහතික වීමක් වන නමුත්, එමඟින් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශණයන් පවතින සෑම විටම විගණනයන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් ප්‍රකාරව සිදු කල ද, එම සාවද්‍ය ප්‍රකාශණ

අනාවරණය කර ඇති බව සහතික නොකෙරේ. සාවද්‍ය ප්‍රකාශයන් වැරදි හා වංචා මත පැන නැඟිය හැකිවන අතර, ඒවා ප්‍රමාණාත්මක ද යන්න තීරණය වනුයේ, පෞද්ගලික හෝ සමස්තයක් වශයෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පරිහරණය තුලින්, මූල්‍ය ප්‍රකාශන භාවිතයට ගනු ලබන්නන් විසින් ඔවුන්ගේ ආර්ථික තීරණයන් කෙරෙහි මෙමඟින් බලපෑම් කර ඇති තත්ත්වයන් තුලය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් ප්‍රකාරව, මාගේ විගණනය, වෘත්තීය විනිශ්චයභාවයක් සහ වෘත්තීය සංදේහවාදයකින් යුක්තව ක්‍රියාත්මක කිරිමට කටයුතු කෙරුණි. මා විසින් තව ද:

- වැරදි හා වංචා හේතුවෙන් මූල්‍ය ප්‍රකාශයන් හී ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් පැවතීමේ අවදානම හඳුනා ගැනිම සහ තක්සේරු කිරිම සිදු කරන අතර එමඟින් විගණන සැලැස්ම, සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ. මේ සඳහා මාගේ විගණන මතය ඉදිරිපත් කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදු කෙරේ. වංචා හේතුවෙන් පැන නැඟුන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්, වැරදි හේතුවෙන් පැන නැඟුන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්, අනාවරණය නොවීමට වඩා අනාවරණය නොවීමේ අවදානම වැඩිය. මන්ද කුමන්ත්‍රනයන්, ව්‍යාජ ලේඛන සෑදීම, හිතාමතා අත් හැරීම, වරදවා විස්තර කිරීම, අභ්‍යන්තර පාලනයන් ප්‍රතික්ෂේප කිරීම ආදිය වංචාවන් මඟින් සිදුවේ.

- අවස්ථාවන් වෙනුවෙන් සිදුකරන විගණනයන් උචිත ව සිදුකිරීම සඳහා වන විගණන සැලැස්ම නිර්මාණය කර ගැනීම සඳහා අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් පිළිබඳව අවධානය යොමු කිරීම. එහෙත් මෙමඟින් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයන්ගේ කාර්යසාධනය පිළිබිඹු කරන මතයන් ඉදිරිපත් කිරීම අරමුණු නොකෙරේ.

- කළමනාකරණය විසින් භාවිතා කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හී උචිත බව, ගිණුම්කරණ ඇස්තමේන්තුන් හී සාධාරණ බව හා අදාල හෙළිදරව් කිරීම් පිළිබඳව ඇගයීමට ලක් කිරීම.

- විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පවත්වා ගෙන යාම උදෙසා බලපෑම් කරනු ලබන සිදුවීම් හා තත්ත්වයන් මඟින් ප්‍රමාණාත්මක අවදානමක් ඇතිවන්නේ ද යන්න, ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම හා ලබා ගත් විගණන සාක්ෂි මත මෙන්ම කළමනාකරණයේ භාවිතයේ උචිත බව මත තීරණය කිරීම. මා විසින් ප්‍රමාණාත්මක අවධානමක් පවතින්නේ යැයි හඳුනා ගත් විට හා එය මාගේ විගණන මතය වෙනස් කිරීමට තරම් ප්‍රමාණවත් නොවන්නේ නම්, ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශණ මත පදනම් ව විගණන වාර්තාවේ හෙළි දරව් කිරීම සඳහා මා විසින් අවධානය යොමු කළ යුතු වේ. විගණන වාර්තාව නිකුත් කරනු ලබන දින දක්වා ලබා ගත් විගණන සාක්ෂි මත මාගේ නිගමනය ලබා දී ඇත. කෙසේ වුව ද, අනාගතයේ සිදුවන සිදුවීම් හා තත්ත්වයන් මඟින් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම යන්නට බලපෑම් එල්ල වීමේ හැකියාවක් පවතී.

- මූල්‍ය ප්‍රකාශණයන් ඉදිරිපත් කිරීම සඳහා පාදක වූ ගණුදෙණු හා සිද්ධීන් අපක්ෂපාති ලෙස ඉදිරිපත් කර ඇත් ද යන්න සහ මූල්‍ය ප්‍රකාශණයන් හී මුළු ඉදිරිපත් කිරීම, අන්තර්ගතය, සැකැස්ම, හෙළි දරව් කිරීම ආදිය ඇගයීමට ලක් කිරීම.

මාගේ විගණනය සිදු කල කාල පරාසය තුල, සුවිශේෂී විගණන හඳුනා ගැනීම, අභ්‍යන්තර පාලනයන්ගේ දුර්වලතා හා අනෙකුත් ගැටලු කළමණාකරනය සමඟ සන්නිවේදනය කරනු ලැබීය.

2. අනෙකුත් නිතීමය හා රෙගුලාසිමය වශයෙන් අවශ්‍ය වාර්තාවන්

2.1 පහත අවශ්‍යයතාවයන් සඳහා වන නියත විධිවිධාන **2018** අංක **19** දරණ විගණන පනතේ ඇතුළත් වේ.

2.1.1 තත්ත්වාගණනය කළ විගණන මතයට පරිබාහිරව අනෙකුත් කරුණු සඳහා බලපාන තත්ත්වයන් විස්තර කර ඇති පරිච්ඡේදයේ, මාගේ පරීක්ෂණය අනුව විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු හා පැහැදිලි කර ගැනීම් මා විසින් ලබාගත් අතරම, **2018** අංක **19** දරණ ජාතික විගණන පනතේ **12(a)** පරිච්ඡේදය ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් උචිත ගිණුම්කරණ වර්තාවන් පවත්වාගෙන යනු ලැබේ.

2.1.2 2018 අංක **19** දරණ ජාතික විගණන පනතේ **6 (1) (d) (iii)** වන පරිච්ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශණයන් පෙර වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇත.

2.1.3 2018 අංක **19** දරණ ජාතික විගණන පනතේ **6 (1) (d) (iv)** වන පරිච්ඡේදය ප්‍රකාරව, මා විසින් පෙර වර්ෂය සඳහා නිර්දේශ කළ නිර්දේශනයන් සහිතව මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කර ඇත.

2.2 ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් කෙරෙහි අනුගමනය කළ ක්‍රියාපටිපාටි සහ ලබා ගත් සාක්ෂි ප්‍රමාණවත් නොවුන බැවින් කිසිවක් මාගේ අවධාණයට පාත්‍ර නොවීය;

2.2.1 2018 අංක **19** දරණ ජාතික විගණන පනතේ **12 (d)** ප්‍රකාරව සිදුකරන ලද ක්‍රියාකාරකම්වලට පරිබාහිරව විශ්වවිද්‍යාලය විසින් එළඹෙන්නා වූ ගිවිසුම් පිළිබඳව, විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩල සාමාජිකයකුගේ සෘජු හෝ වක්‍රව ඒ පිළිබඳව උනන්දුවක් දැක්වීම පිළිබඳව කරුණු ගෙන හැර දැක්වීම.

2.2.2 2018 අංක **19** දරණ ජාතික විගණන පනතේ **12 (f)** ඡේදයට අමතරව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් අදාල ලිඛිත නීතීන්, සාමාන්‍ය හා විශේෂ උපදේශනයන් සම්බන්ධයෙන් කටයුතු නොකර ඇති තත්ත්වයන් ගෙන හැර දැක්වීම;

නිතිරීති/ නියමයන්වලට අදාල යොමුව	සටහන
---	---

(a) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුල්‍ය රෙගුලාසීන්හී **571** වන මූල්‍ය රෙගුලාසි වගන්තිය	මූල්‍ය වටිනාකම රු.**566,000** වන ටෙන්ඩර් තැන්පතූන් **80**ක් සහ මූල්‍ය වටිනාකම රු.**18,267,884** වන රඳවා ගත් තැන්පතූන් **40**ක ප්‍රමාණයක්, වසර **02** සිට වසර **08**ක කාල සීමාවක් දක්වා පියවා එම පිරිස් වෙත ලබා දීමට හෝ විශ්ව විද්‍යාලය ලද ආදායමක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කර නොමැත.
(b) උසස් අධ්‍යාපන ආයතනයන් හී හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ ආයතන සංග්‍රහයේ අනු කොටස් **3.1** හි **XX** පරිච්ඡේදය සහ **2017** ජූලි **10** දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන චක්‍රලේඛ අංක **10/2017.**	කාර්යය මණ්ඩලයේ සියළු දෙනාගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රයක සටහන් විය යුතුය. එසේ වුවද අධ්‍යයන කාර්යය මණ්ඩලය අදාළ නීතියට අනුව කටයුතු කිරීම ප්‍රතික්ෂේප කර තිබූ අතර ඔවුන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් සතුටුදායක පාලන ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි.

2.2.3 2018 අංක **19** දරණ ජාතික විගණන පනතේ **12 (g)** ඡේදය ප්‍රකාරව, විශ්වවිද්‍යාලය විසින් එහි බලතල, කාර්යයන් සහ සිදු කළයුතු කර්තවයන් සිදු කිරීමට අපොහොසත් වී ඇති බව පෙන්නුම් කළ යුතුය.

(a) **2015** වසරේ දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් අධ්‍යන කාර්යයමණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති පරිදි අධ්‍යයන ආචාරධර්ම සහ වගවීම සම්බන්දයෙන් ප්‍රධානී, සම්මාණනීය මහාචාර්ය, මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කථිකාචාර්ය, I ශ්‍රේණියෙහි උපදේශක සහ II ශ්‍රේණියෙහි උපදේශකවරුන් විසින් අවම වශයෙන් සිසුන් සඳහා දක්වන පැය ගණන ඔවුන්ගේ කාල සටහන ප්‍රකාරව **180, 300, 360, 380, 450, 480** සහ **510** වශයෙන් විය යුතුය. එහෙත් විගණනය සඳහා ඉදිරිපත් කරනු ලැබූ දත්ත මත, සිසුන් සඳහා දක්වන පැය **55,000** ප්‍රමාණය **2021** වසර සඳහා පීඨ **06**හි **140**ක් වන අධ්‍යයන කාර්යය මණ්ඩලය තුල බෙදා හැරිය යුතුව තිබුණ ද, **23,665** පැය ප්‍රමාණයක් පමණක්, එනම් අධ්‍යයන ආචාර ධර්ම තුලින් **43%** ප්‍රමාණයක් නියෝජනය වන පරිදි බෙදා හැරීම දක්නට ලැබේ. තව ද, විගණනය වෙත කිසිදු වාර්තාවක් මෙම ආචාරධර්මයන් තහවුරු කිරීම සඳහා, එනම් ශිෂ්‍යය පර්යේෂණ අධීක්ෂණය සහ කාර්මික ස්ථානගත කිරීම , සායනික කටයුතු සහ අධ්‍යයන සම්බන්ධීකරණයන් සඳහා වන දත්ත ඉදිරිපත් කර නොමැත. මේ නිසා මුළු ශිෂ්‍ය සම්බන්ධීකරණ පැය සහ කාර්යමණ්ඩලයෙහි මුළු වැඩ ප්‍රමාණය මත, විශ්ව විද්‍යාලය විසින් අධ්‍යයන ආචාරධර්ම සංවර්ධනය කරමින් මාර්ගෝපදේශයන් නිර්මාණය කර ඇති බවට පෙන්නුම් නොකෙරේ.

(b) බාහිර විභාග පාඨමාලාවන්හී වන ශිෂ්‍යය අත්පොත ප්‍රකාරව, කලා උපාධීන්, ව්‍යාපාර පරිපාලනවේදී උපාධීන් හා වාණිජවේදී උපාධීන් නිම කිරීම සඳහා වන අවම කාලය ලෙස දැක්වෙනුයේ අධ්‍යයන වසර තුනකිණි. කෙසේ වුවද, ඉහත උපාධීන් නිම කිරීම සඳහා අවම

වශයෙන් වසර පහක සිට වසර හතක පමණ කාල සීමාවක් ගොස් ඇත. එලෙස උපාධීන් අවසන් කිරීමට ප්‍රමාද වීම නිසා ශිෂ්‍යයන් හට රැකියාවන් සහ රැකියා අවස්ථාවන් ලබා ගැනීමේ දී එය අවාසිදායක ලෙස බලපෑම් ඇති කරනු ලැබේ.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (h) ඡේදය ප්‍රකාරව, විශ්වවිද්‍යාලය විසින් එහි සම්පත් ප්‍රසම්පාදනය සහ භාවිතා කිරීමේ දී ඒවා ආර්ථිකමය, කාර්යක්ෂමතාවයක් සහ සඵලදායකත්වයකින් යුක්තව අදාල කාලසීමාව තුල දී අදාල නීතීමය තත්ත්වයන් තුල කටයුතු නොකිරීම දක්නට ලැබේ;

කොන්ත්‍රාත් පිරිවැය රු.138,444,958 වන මල්වත්ත කෘෂි තාක්ෂණික උද්‍යානයෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන කොන්ත්‍රාතුව 2021 මාර්තු 29 වන දින කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කර ඇති අතර එය ගිවිසුම ප්‍රකාරව 2022 ජුනි මස 28 වන දින වන විට නිම කල යුතුව තිබුණි. එහෙත්, 2022 මැයි මස 01 දින වන විට ප්‍රගතිය 35% වන අතර පිරිවැය රු. 56,273,588 වන වැඩ ඒකක 09ක් ආරම්භ කිරීමටවත් කටයුතු කර නොමැත.

2.3 අනෙකුත් විගණන නිර්දේශ

(a) 2021 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින වන විට දී, කාර්යය මණ්ඩල නිළධාරීන්ගේ, කොන්ත්‍රාත්කරුවන්ගේ සහ ආයතන මඟින් අයවිය යුතුව තිබූ, රු. 1,876,449 මුදල වසර 01 සිට වසර 20ක කාලයක් දක්වා අයකර ගැනීමට කටයුතු කර නොමැත. තව ද, 2021 දෙසැම්බර් මස 31 වන දිනට බැඳුම්කර ගිවිසුම් උල්ලංඝනය කරිම හේතුවෙන් කථිකාචාර්යවරුන්ගෙන් අයවිය යුතු රු. 18,337,779ක මුදලක් අය කරවා ගෙන නොමැති අතර, වසර 12ක පමණ කාලයක සිට අයකරවා ගත යුතු රු. 1,043,137 ප්‍රමාණයක් අයකරවා ගැනීමට කටයුතු කර නොමැත.

(b) වසර 02කට අධික කාලයක් ගත වුවද, වටිනාකම රු .687, 007 ක පියවිය යුතු මුදලක් පියවා දැමීමට කටයුතු කර නොමැත.

(c) 2018 වර්ෂයේ දී පිරිවැය රු. 10,221,473ක වටිනාකමක් දරා මහා පරිමාණ ගබඩාවෙහි වැඩ කටයුතු නිමකල අතර සහ පිරිවැය මිලියන රු.5.25 වියදමක් දරා මෙය නවීකරණය කිරීම සඳහා ඉංජිනේරු වැඩමුළුව වෙත 2021 පෙබරවාරි මස 23 වන දින භාරදෙනු ලැබීය. කෙසේ වුවද, 2022 මැයි 26 දින වන විට ද, මෙහි උපකරණ සවීකිරීමේ කටයුතු නිසියාකරව සිදුකර නොතිබූ බැවින් මෙම වැඩමුළුව සම්පූර්ණ වශයෙන් භාවිතයට ගෙන නොමැත.

(d) 2017 වසරේ සහ 2019 වසරේ දී පිරිවැය රු 87,186,796 දරමින් මිල දී ගෙන තිබූ රසායනාගාර උපකරණ වසර 02 සිට වසර 05ක කාලයක් දක්වා භාවිතයට ගෙන නොමැත.

(e) අනෙකුත් විශ්ව විද්‍යාලයන් විසින් සාමාන්‍ය පරිදි සිදු කරනු ලබන, එනම් REPO තැන්පතුන් හී දිනය අවසානයේ දී මුදල් තැන්පත් කර එමඟින් අතිරේක ආදායමක් ලබා ගත්ත

ද, විශ්ව විද්‍යාල පරිපාලන නිලධාරීන් විසින් එලෙස කටයුතු නොකිරීම හේතුවෙන් ආදායම් ඉපයීමට කටයුතු කර නොමැති අතර වටිනාකම රු. මිලියන **84** සිට රු. මිලියන**211** ක් දක්වා ප්‍රමාණයක් ජංගම ගිණුම් හි තැන්පත්ව ඇති බව නිරීක්ෂණය කරන ලද දිනයනි හී, දිනය අවසානයේ දී නිරීක්ෂණය විය.

(f) පසුගිය වසර ගණනාවක කථිකාචාර්යවරුන් සඳහා පර්යේෂණ දීමනාවන් ගෙවා ඇති අතර නිරීක්ෂණය කරන ලද වසරේ දී එය රු. **80,871,935** පමණ ප්‍රමාණයකි. කෙසේ වුවද, බුද්ධිමය දේපළ එනම් නව නිපැයුම් සඳහා වන පේටන්ට් බලපත්‍ර වැනි දෑ අත්පත් කර ගැනීමට කටයුතු කර නොමැති අතර වෙනත් කිසිදු ජයග්‍රහණයන් ලබා ගැනීමට ද අසමත් වී ඇත. ඒ අනුව, මෙය සලකා බැලීමේ දී, රටෙහි හෝ ප්‍රදේශයෙහි සුභ සාධනය සඳහා මෙම පර්යේෂණ දීමනාවන්ගෙන් කිසිදු දායකත්වයක් ලැබී නොමැත.

(g) රාජ්‍යය විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන ශ්‍රේණිගත කිරීම සිදුකරනු ලබන වෙබෝ මේට්‍රික් ශ්‍රේණිගත කිරීම් හී විශ්ව විද්‍යාලය සතු ශ්‍රේණිය **2022** වර්ෂයේ දී, **13** වන ශ්‍රේණියේ සිට **16** වන ශ්‍රේණිය දක්වා පහත වැටී ඇත.

(h) රටෙහි ජාතික ආර්ථිකයට සහ රැකියා වෙළඳපොල පාදක කරගෙන විශ්ව විද්‍යාලයන් හී පවතින විෂය නිර්දේශයන් යාවත්කාලීන කලයුතු අතර විෂය මාලාවන් තුල කාර්මික විෂයයන් සහ භාෂා කුසලතා අන්තර් ගත කොට නිරන්තර වෙනස්වීම් සඳහා භාජනය වන රැකියා වෙළඳපළ වෙත ගැලපෙන අයුරින් සැකසිය යුතුව පවතී. කෙසේ වුවද, කළමණාකරණය සහ වාණිජ පීඨයෙහි, ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය සහ වාණිජවේදී උපාධින් සඳහා වන විෂය නිර්දේශයයන් **2012** වසරේ සිට එනම් වසර **09**ක කාලයක් දක්වා යාවත්කලීන කර නොමැති අතර , ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨයන්දි වන කලා උපාධීන් **2005** වසරේ සිට එනම් වසර **16**ක කාලයක් දක්වා යාවත්කාලීන කර නොමැති බව නිරීක්ෂණය විය.

(i) ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය **(Lanka Education and Research Network - LEARN)** විසින් සීමා රහිත දත්ත ජාල සම්බන්ධීකරණ පහසුකම් සපයනු ලැබූ අතර ඒ සඳහා **2021** වර්ෂයේ දී රු **12,835,303** ගෙවනු ලැබිණි. අනෙක් අතට මෙම අරමුණු වෙනුවෙන්ම, රු . **11,869,245** මුදලක් මොබිටෙල් **wifi** පහසුකම් සඳහා **2021** වර්ෂයේ දී වැය කර ඇත. ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය **(LEARN)** උපයෝගී කර ගනිමින් දත්ත ජාල සම්බන්ධීකරණය සඳහා වන ව්‍යදම් පාලනය හා අවම කර ගැනීම සම්බන්දව කටයුතු කර නොමැත.

(j) විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව, අනුමත වූ අධ්‍යයන ශ්‍රේණි සඳහා වූ තනතුරු **424**ට අමතරව, පුරප්පාඩු **112**ක් සහ අනුමත වූ පරිපාලන ශ්‍රේණි තනතුරු **142**ට අමතරව, කාර්මික ශ්‍රේණි සහ අධ්‍යයන සහයක ශ්‍රේණි **62**ක් **2021** දෙසැම්බර් **31** දින වන විට ද පුරප්පාඩුව පැවතුණි.

(k) 2021 වර්ෂය සඳහා වන උපක්‍රමික සැලැස්ම ප්‍රකාරව, අරමුණු 06ක් යටතේ ක්‍රියාකරකම් 19ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. මේ අතුරින්, ක්‍රියාකාරකම් 17ක් ක්‍රියාත්මක කිරීමට ආරම්භ කර නොමැත.

(l) 2017 සිට 2020 වර්ෂ සඳහා, පර්යේෂණ ප්‍රදානයන් ලෙස රු. 6,545,485 මුදලක් නිලධාරීන් විසි දෙනෙකු සඳහා ප්‍රදානය කර තිබුණ ද, 2022 ජුනි 15 දින වන විට දී නිලධාරීන් දස දෙනෙකු විසින් මෙම පර්යේෂණයන් නිම කොට නොතිබුණි.

(m) මෙම වර්ෂය සලකා බැලීමේ දී, පිරිවැය රු 201,368,432 වන පුස්තකාල ග්‍රන්ථ සහ පුස්තකාල වාර සඟරා සත්‍යාපනය කිරීමේ කටයුතු සිදුකර නොමැති අතර අවසාන වරට සත්‍යාපනය කර ඇත්තේ 2017 වසරෙහිය.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

7.9. විගණකාධිපතිගේ වාර්තාව සඳහා නිරීක්ෂණ

SEUSL /VC/AR/2022/02

2022 අගෝස්තු මස 24

විගණකාධිපති ,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන ඡේදය ප්‍රකාරව 2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශණ මත විගණකාධිපති වාර්තාව.
මෙය ඔබ විසින් අප වෙත 2022 අගෝස්තු මස 01 යොමු කල BTC/C/SEUSL/01/21/01 වාර්තාව සඳහා අප පහත සඳහන් නිරීක්ෂණ ලබා දෙන්නෙමු.

1. මූල්‍ය ප්‍රකාශණ

1.1 තත්ත්වාගණනය කළ විගණන මතය

1.2 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

(a) ශුද්ධ වත්කම් වෙන්ස්වීමේ ප්‍රකාශයෙහි පෙර වසරෙහි ගැලපුම් ගලපා කටයුතු කිරීමට පියවර ගෙන ඇත.
(b) මේ සඳහා කමිටුවන් කිහිපයක් අරඹා ඇත. කෙසේ වුවද, විවිධ හේතූන් මත මෙම කර්තවයන් සම්පූර්ණ කිරීමට නොහැකි විය. මෙම ක්‍රියාවලිය ඉක්මන් කිරීමට කටයුතු කරනු ලැබේ.
(c) මඩකලපුව තක්සේරු දෙපාර්තමේන්තුවේ සහය ගෙන විශ්ව විද්‍යාලයෙහි ඉඩම් නැවත අගය කිරීමේ හි කටයුතු සිදුකිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබිණි. ඒ සඳහා අවශ්‍ය නියමිත ලිපි ලේඛන ඔවුන් විසින් විශ්ව විද්‍යාලයෙන් ලබාගෙන ඇති අතර එය ඉක්මණින් නිමකර අවසන් කරන බව දැනුම් දී ඇත.

(d) මෙය සැසඳීම සඳහා වන සැසඳුම් කමිටුවක් පිහිටුවා, ඒ සඳහා අදාල වන ලී බඩු සහ උපකරණ පිලිබඳ සියලු තොරතුරු භෞතිකව ලබා ගෙන වාර්ෂික සමීක්ෂණ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ සමඟ සැසඳීම සඳහා වන ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. මෙම සැසඳීමේ ක්‍රියාපිළිවෙත දිගුකාලීන වැඩසටහනක් වන බැවින්, එය අවසන් කිරීම සඳහා සැලකිය යුතු කාලයක් වැය වේ.

1.3 විශ්වවිද්‍යාලයෙහි **2021** වර්ෂයේ වාර්ෂික වාර්තාවේ සඳහන් අනෙකුත් තොරතුරු

1.4 මූල්‍ය ප්‍රකාශණ සඳහා කළමනාකරණයේ සහ රාජ්‍යය පාලන අධිකාරියේ වගකීම

1.5 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම උදෙසා විගණකවරුන්ගේ වගකීම

2. අනෙකුත් නිතීමය හා රෙගුලාසිමය වශයෙන් අවශ්‍ය වාර්තාවන්

2.1

2.1.1

2.1.2

2.1.3

2.2

2.2.1

2.2.2

නිතිරීති/ නියමයන්වලට අදාල යොමුව සටහන

(a) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය රෙගුලාසීන්හී **571** වන මූල්‍ය රෙගුලාසි වගන්තිය

විස්තරය	අගයය (රු.)	තත්ත්වය
කොන්ත්‍රාත්කරුවන්ගේ රැඳවුම් මුදල්	13,142,851.82	වසර **02** කට අධික කාල සීමාවක් රඳවා ගත් මෙම රැඳවුම් තැන්පතූන් සහ ආපසු ගෙවිය හැකි තැන්පතූන් (refundable deposit) පියවා දැමීමට හෝ අදාල අංශයන්ගේ නිර්දේශ ප්‍රකාරව, විශ්ව විද්‍යාලය ලද ආදායමක් ලෙස හඳුනා ගැනීමට අවශ්‍ය නිසි පියවර ගැනීමට නියමිතය.
සැපයුම්කරුවන්ගේ රැඳවුම් මුදල්	5,125,032.25	
ආපසු ගෙවිය හැකි තැන්පතූන්	434,000.00	

(b) උසස් අධ්‍යාපන ආයතනයන් හී හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ ආයතන සංග්‍රහයේ අනු කොටස් **3.1** හි **XX** පරිච්ඡේදය සහ **2017** ජූලි **10** දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන චක්‍රලේඛ අංක **10/2017**	ශ්‍රී ලංකාවෙහි පවතින විශ්වවිද්‍යාල පද්ධතියෙහි අධ්‍යයන කාර්යය මණ්ඩලය, සම්මතයක් ලෙස පැමිණීම සහ පිටවීම සටහන් නොකෙරේ. අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් විවිධ ඉගෙනුම් සහ ඉගැන්වීම් කටයුතු, පර්යේෂණ සහ ප්‍රජා ව්‍යාපෘති වැඩසටහන් වල නිරත වන බැවින් ඔවුන්ගේ වැඩ කටයුතු පැය 08ක කාලයක් දක්වා සීමා කළ නොහැක. එමනිසා මෙය ප්‍රායෝගික නොවේ.

2.2.3 **2018** අංක **19** දරණ ජාතික විගණන පනතේ **12 (g)** ඡේදය ප්‍රකාරව, විශ්වවිද්‍යාලය විසින් එහි බලතල, කාර්යයන් සහ සිදු කළයුතු කර්තවයන් සිදු කිරීමට අපොහොසත් වී ඇති බව පෙන්නුම් කළ යුතුය.;

(a) විගණන වර්තාවෙහි සඳහන් පැය ගණන පදනම් වනුයේ, කයීකාචාර්යවරුන්ගේ ඉගැන්වීම් පැය ගණනය. කෙසේ වුවද, ඔවුන් ඉගෙනුම් සහ ඉගැන්වීම් කටයුතු සඳහා පමණක් නිරත නොවන අතර, පර්යේෂණ, සුපරීක්ෂණ සහ පරිපාලන කටයුතුවල ද නිරත වේ. තව ද, අධ්‍යයන ආචාරධර්ම සහ වගවීම සම්බන්ද ව විශ්ව විද්‍යාලය විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ චක්‍රලේඛ ප්‍රකාරව, මුළු ශිෂ්‍ය සම්බන්දතා පැය ගණන සහ අධ්‍යයන කාර්යය මණ්ඩල මුළු වැඩ කොටස දැක්වෙන ලෙස නව සංශෝධිත මාර්ගෝපදේශයක් පිළියෙල කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.

(b) ශිෂ්‍යය කණ්ඩායමෙහි ශිෂ්‍යය සංඛ්‍යාව ඉහල අගයක පවතින බැවින් උත්තරපත්‍ර ඇගයීමේ කටයුතු සඳහා සැලකිය යුතු කාලයක් ගත ව ඇති බවට බාහිර උපාධි ඒකකය සහ වෘත්තීය අධ්‍යාපන ඒකකය විසින් පැහැදිලි කිරීම් කර ඇත. එමනිසා, අප විසින් කමිටු ඇගයුම් (panel marking) ක්‍රමයක් හඳුන්වා දුන් අතර මාස තුනක කාලයක් ඇතුලත ප්‍රතිඵල නිකුත් කිරීමට තීරණය කරන ලදී. ප්‍රතිඵල නිකුත් කිරීමට ප්‍රමාද වන පිරිස් වෙත ඔවුන්ගේ ගෙවීම් අඩු කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබීය.

තව ද, 2014/2015 සහ 2015/2016 වන කණ්ඩායම් සඳහා වන ඇගයුම් කටයුතු පහත හේතූන් මත ප්‍රමාද විය.

1. පාස්කු ප්‍රහාරයට සම්බන්ධ ව පැන නැගුණු සීමා කිරීම් සහ තත්ත්වයන්.

2. කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් විශ්ව විද්‍යාලය වසා තැබීම සහ මාර්ග ගත ක්‍රමය ඔස්සේ විභාග පැවැත්වීම සම්බන්ධයෙන් නව ක්‍රියාපටිපාටීන් බිහිවීම මෙන්ම ඒ සඳහා වන අනුමැතියන් අදාල බලධාරීන් මඟින් ලබා ගැනීම ප්‍රමාදවීම හේතුවෙන්, උත්තරපත්‍ර ඇඟයීමේ කටයුතු සිදු කිරීමට ප්‍රමාද විය.

මීට පරිබාහිරව, බාහිර උපාධි ඒකකය සහ වෘත්තීය අධ්‍යාපන ඒකකය විසින් ඔවුන්ගේ සියලුම ප්‍රමාද වූ වැඩකටයුතුන් අද වන විට හැකි උපරිමයෙන් අවසන් කිරීමට කටයුතු කොට ඇත.

2.2.4 මෙම වැඩ කටයුක්ත පිරිනමන අවස්ථාවේ දී, වර්තමානයේ පවතින වසංගත තත්ත්වයන් උත්සන්න වෙමින් පැවතුණි. පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වයන් සහ පසුව පැවති අහිතකර කාලගුණ තත්ත්වයන් මත මෙන්ම රට වසා තැබූ තත්ත්වයන්, ගමනාගමන අඩපණ වීම්, ආනයන තහනම්, සම්පත් හිඟය, ශ්‍රමික හිඟය සහ කොන්ත්‍රාත් අමුද්‍රව්‍යවල කඩිනම් මිල උච්ඡාවචණයන් නිසා කොන්ත්‍රාත්කරුට මෙහි සඳහන් කාර්යයන් 09, ආරම්භ කිරීමට නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි. තව ද, කඩින් කඩ ඇති වූ වර්ෂාකාරී තත්ත්වයන් හේතුවෙන් මෙම කාර්යයන් ආරම්භ කිරීම සඳහා බාධා ඇති වීම ද, මෙම කර්තවයන් ප්‍රමාද වීමට හේතු විය. මෙම වැඩ කාර්යයන්, වර්තමානය වන විට ආරම්භ කර ඇති අතර ඉදිකරමින් පවතී. මේ වන විට 40%ක පමණ කාර්යයන් සම්පූර්ණ කර ඇත. අවසන් කළ වැඩ සහ කෙරීගෙන යන වැඩ කාණ්ඩ වශයෙන් කරගෙන යමින් පවතී. වැඩ කටයුතු පිලිබඳ තත්ත්වයන් නීරික්ෂණය කිරීම සඳහා සහ කඩිනම් කිරීම සඳහා කඩින් කඩ ඒ සඳහා වන ප්‍රගති සමාලෝචන කමිටුන් පවත්වනු ලැබේ.

2.3 අනෙකුත් විගණන නිර්දේශ

(a) <u>අයවිය යුතු මුදල්</u>

<u>ණය සහ අත්තිකාරම්</u>

නම	විස්තරය	වර්ෂය	වටිනාකම	අය කරවා ගැනීම සම්බන්ධව වර්තමාන තත්ත්වය
ඒ.ආර්.එම්. ඉම්තියාස්	ආපදා ණය	2001	29,058	හිඟ මුදල් අයකරවා ගැනීම සම්බන්ධයෙන් වන නඩුව විභාග වෙමින් පවති. – නඩු අංක. DCA/M/1251/19
ඒ.එම්. ශෙහාම්	ආපදා ණය	2018	49,984	පවතින අර්ථසාධක අරමුදල් මඟින් අයකරවා ගැනීමට පියවර ගෙන ඇත.
ඒ.එම්. ශෙහාම්	උත්සව දීමනා	2018	27,693	පවතින අර්ථසාධක අරමුදල් මඟින් අයකරවා ගැනීමට පියවර ගෙන ඇත.
එස්.එම්.ආලිෆ්	අයකරවා ගත යුතු වැටුප් මුදල්	2018	1,445,948	සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් වන නඩු කටයුත්තක් විභාග වෙමින් පවතී.– නඩු අංක. LT/BT/362/2018
ඒ.එන්. නව්ෂාඩ්	අයකරවා ගත යුතු වැටුප් මුදල්	2019	68,287	ඔහුගේ මාසික වැටුපෙන් අයකරවා ගැනීමට නියමිතය.
අයි. එස්.	අයකරවා ගත	2019	8,685	අනධ්‍ය කාර්යය මණ්ඩල

නර්සිත්	යුතු වැටුප් මුදල්			ඒකකය විසින් අදාල බලධාරීන් වෙත ලිපියක් යොමුකර ඇත.

<u>ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයට අයවිය යුතු මුදල්</u>

අංකය	විස්තරය	වටිනාකම (රු.)	අය කරවා ගැනීම සම්බන්ධව වර්තමාන තත්ත්වය
1	කේ. ඩී. ඊබට්	82,238.53	ඉංජිනේරුතුමා විසින් අදාල කොන්ත්‍රාත්කරුවන් වෙත ලිපියක් යොමුකර ඇත.
2	ඇන්තෝනි බිල්ඩස්	4,374.40	
3	අමීන් කන්ස්ට්‍රක්ෂන්	36,198.36	
4	සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විස් ප්‍රයිවට් ලිමිටඩ්	26,631.24	
5	අබ්දුල් අසීස් (භාවිතා කල විදුලි ඒකක සමඟ)	6,672.93	
6	ස්මාර්ට් පවර් ඉංජිනියරින්	1,000.00	
7	අයි. එල්. සම්සුඩීන්	28,000.00	සුභ සාධක ඒකකය විසින් ලිපියක් යොමුකර ඇත.
8	එන්. එම්. අස්ලාම්	5,000.00	සුභ සාධක ඒකකය විසින් ලිපියක් යොමුකර ඇත. – මෙම හිඟ මුදල නැවත ලබා දීම සඳහා ආපනශාල හිමියන්ගෙන් ලබාගත් තැන්පතූන් මඟින් අයකරවා ගත හැක.
9	ඒ. එම්. සබ්‍රි ඉර්ෂාඩ්	1,000.00	
10	එම්. නාසික් මොහොමඩ්	12,000.00	
11	එස්. ඒ. හමීඩ්	6,000.00	
12	ඒ.ආර් ෆිනාස්	5,000.00	
13	ඒ. එම්. සබ්‍රි ඉර්ෂාඩ්	5,000.00	
14	එම්. එම්. රියාස්	3,000.00	
15	ඒ. එම්. නස්තාර්	13,000.00	
16	ඒ. ඒ. ලතීෆ් (Multishop) (භාවිතා කල විදුලි ඒකක සමඟ)	11,678.57	නියෝජ්‍ය ලේඛකාධිකාරී/ පරිපාලන ඒකකය විසින් ලිපියක් යොමුකර ඇත.

<u>බැඳුම්කර උල්ලංඝනයන්</u>

නම	විස්තරය	වර්ෂය	වටිනාකම (රු.)	අය කරවා ගැනීම සම්බන්ධව වර්තමාන තත්ත්වය
ඒ. ආර්. එම්. ඉම්තියාස්	බැඳුම්කර උල්ලංඝනයන්	2009	1,043,137.22	හිඟ මුදල් අයකරවා ගැනීම සම්බන්ධයෙන් වන නඩුව විභාග වෙමින් පවති. – නඩු අංක. DCA/M/1251/19

තව ද, 261 වන පාලක සභා තීරණය පරිදි, බැඳුම්කර උල්ලංඝනයන්ගෙන් අයවිය යුතු අගයයන් ඇපකරුවන්ගෙන් අයකරවා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(b) වසර **02** කට අධික කාල සීමාවක් රඳවා ගත් මෙම තැන්පතූන් පියවා දැමීමට හෝ අදාල බලධාරීන්ගෙන් අනුමැතිය ලැබීමෙන් පසු, විශ්වවිද්‍යාලීය ආදායමක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(c) සටහන් තබා ගන්නා ලදී. ඉංජිනේරු වැඩ එකකය විසින් මහා ගබඩාව පහත පරිදි උපයෝජනය කරනු ලැබේ.

පහත වැඩමුළු ඒකක, ඉංජිනේරු වැඩමුළු II (මහා ගබඩාව) සඳහා මාරු කිරීම් සිදුකර ඇත. :
1). වාත්තු නිෂ්පාදන (Foundry)
2). තහඩු ලෝහ ඒකකය ය සහ සවිකිරීම ඒකකය සහ (Sheet metal workshop, and Fitting workshop, and)
3). මෝටර් රථ වැඩ ඒකකය- ඩීසල් එන්ජින් සහ එන්ජින් ඩයිනමෝ මීටර් නොමැතිව (Automobile workshop except Engine Dynamo meter with Diesel Engine)

1. වාත්තු නිෂ්පාදන: වාත්තු නිෂ්පාදනයන්ගේ සියලුම උදුන් සඳහා වන තාප ප්‍රභව වනුයේ LPG වේ. LPG සැපයුම සඳහා වන නල මාර්ග පද්ධතිය සැකසීම 2022.05.19 වන දින අවසන් කෙරිණි. උදුනෙහි කටයුතු සිදුකිරීමෙහි වගකීම පවතිනුයේ සැපයුම්කරු වෙතය. වර්තමානයේ පවතින ප්‍රවාහන අපහසුතා හුවා දක්වමින් ඔහුගේ පැමිණීමේ කටයුතු පමා කරනු ලැබේ. උදුනෙහි කටයුතු සිදුකිරීමෙන් පසුව, මෙම Centrifugal Casting Demonstration Kit, Castings සහ Cores Demonstration kit, Hollow ware casting demo kit, Compressor සහ Vacuum Cleaner, සහ වාත්තු මෙවලම් පරිහරණයට ගත හැකි වේ.

2. තහඩු ලෝහ ඒකකය සහ සවිකිරීම ඒකකය: තහඩු ලෝහ ඒකකය සහ සවිකිරීම ඒකකය මඟින් (E19) ශිෂ්‍යය කණ්ඩායම සඳහා වන දෙවැනි වාර ප්‍රායෝගික පරීක්ෂණ ඉංජිනේරු වැඩමුළු II (මහා ගබඩාව) තුල දී සිදුකරමින් පවතී.

3. මෝටර් රථ වැඩ ඒකකය- ඩීසල් එන්ජින් සහ එන්ජින් ඩයිනමෝ මීටර් නොමැතිව:
වාහන තිරිංග පරීක්ෂණ යන්ත්‍ර, ගෑසෝලයින් එන්ජින්, වීල් අලයින්මන්ට් උපාංග -
සැපයුම්කරු විසින් වාහන තිරිංග පරීක්ෂණ යන්ත්‍ර සවීකිරීම් සිදු කර නොමැත. සැපයුම්කරු විසින් ගෑසෝලයින් එන්ජින් පිළිබඳව ද මඟ පෙන්වීම ලබා දිය යුතුව ඇත.

වීල් අලයින්මන්ට් උපාංග භාවිතය සඳහා සූදානම්ව පවතී. මෙම උපාංග, E17 සිසු කණ්ඩායම ඔවුන් ඉදිරි අනාගතයේ දී 6 වන වාරය සඳහා පැමිණි විට මඟ පෙන්වීම ලබා ගැනීමට නියමිතව ඇත.

අනෙකුත් සියලුම සවිකිරීමේ කාර්යයන් අවසන් කර ඇති අතර වර්තමානයේ දී, මෙම වැඩමුළු ඒකකය සම්පූර්ණයෙන්ම භාවිතයට ගනු ලැබේ.

(d) යන්ත්‍ර තුනක් තොරව, අනිකුත් සෑම උපකරණයක්ම, එනම් 2017 සිට 2019 කාලයේ දී මිලදී ගත් උපකරණ නිසි ලෙස සවිකිරීම් කටයුතු සිදුකර ඇති අතර ඒවා, භාවිතයට ගනු ලැබේ. ඉහත සඳහන් එම යන්ත්‍ර ත්‍රිත්වය සම්බන්ධව මඟ පෙන්වීම ලබා ගැනීමට නියමිතව ඇත.මෙම මඟ පෙන්වීම ලබා ගත් පසු, මෙම යන්ත්‍ර භාවිතයට ගැනීම ආරම්භ වේ. මෙම මඟ පෙන්වීම ලබා ගැනීම 2022 සැප්තැම්බර් මස තුල දී අවසන් කිරීම සඳහා සැපයුම්කරු විසින් පොරොන්දු වී ඇත.

(e) ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ජංගම ගිණුම්හී පවතින අගයයන් Overnight ආයෝජන ගිවිසුම් හී ආයෝජනය කිරීම සඳහා වන තත්ත්වයන් සම්බන්ධයෙන් පෙර කාලයේ දී බැංකු නිළධාරීන් සමඟ සන්නිවේදනය කරගනු ලැබුණි. මෙම ශාඛාවන් තුල ඉහත සඳහන් එම පහසුකම් නොපවතින බැවින් පසුව, එම අතිරික්ත අරමුදල් කෙටි කාලීන තැන්පතූන්හී අයෝජනය කෙරිණි.
කෙසේ වුවද, විශ්ව විද්‍යාලයීය මෙම ජංගම ගිණුම් තැන්පතූන් Overnight ගිවිසුම් හී අයෝජනය කිරීම සම්බන්ධයෙන් විස්තර ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින්, එම තැන්පතූන් පවතින අඩ්ඩාලච්චේන මහජන බැංකු ශාඛාව වෙත, නිල ඉල්ලීමක් කරනු ලැබීය. ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ මෙම ඉල්ලීම ක්‍රියාත්මක කිරීම සඳහා එම ශාඛාව විසින්, පසුව එම ඉල්ලීම අදාල මහජන බැංකු ප්‍රධාන කාර්යයාලය වෙත යොමු කොට ඇත.

මෙම ජංගම ගිණුම් තැන්පතූන් Overnight අයෝජනය කිරීමට අදාල ක්‍රියාකරකම් ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය විසින් ඉටුකරන අතර ම, එම ක්‍රියාවලිය නිරතුරුවම පසු විපරම් කරමින් එම ජංගම ගිණුම් තැන්පතූන් Overnight ගිවිසුම් හී අයෝජනය කිරීමට අදාල කටයුතු කරනු ලැබේ.

(f) 2011 වර්ෂයේ අප්‍රේල් මස 20 වන දින නිකුත් කරන ලද, උසස් අධ්‍යාපන ආයතනයට අදාල චක්‍රලේඛ 1/2011 අනුව, 2011 වර්ෂයට අදාල රජය සතු අයවැය යෝජනා මත විශ්වවිද්‍යාලය විසින් එම පර්යේෂණ දීමනාවන් ගෙවනු ලැබුණි.

ඉහත සඳහන් චක්‍රලේඛනය පදනම් කරගෙන ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් පහත ක්‍රියාවලිය අනුගමනය කරනු ලැබේ.

අදාල වර්ෂය ආරම්භ වන ජනවාරි පළමු වන දා සිට දෙසැම්බර් 31 දින දක්වා අදාල පර්යේෂණ දීමනාවන් ලබා ගැනීම සඳහා පහත සඳහන් අවශ්‍යතාවයන්ගෙන් අඩුම වශයෙන් එකක් හෝ සපුරා තිබිය යුතුය;

(i) පර්යේෂණ දීමනා සඳහා හිමිකම් පවතින වසරේ දී, ජාත්‍යන්තර වශයෙන් සිදුකල ස්වයං / කණ්ඩායම්, විද්‍යාත්මක වශයෙන් සිදුකල දේශීය සහරා සඳහා වන අනුමැතිය සහ/ හෝ ආදාල සම්මන්ත්‍රනයන්/ සමුළුන්හි ඉදිරිපත් කිරීම හෝ තාක්ෂණික සැසීන් මඟින් සිදුකල පර්යේෂණ ප්‍රතිඵලයන් ප්‍රසිද්ධ කිරීම සඳහා අවශ්‍ය, ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර ඇතිවීම.

(ii) පර්යේෂණ දීමනා සඳහා හිමිකම් පවතින වසරේ දී, එනම්, ජාත්‍යන්තර සහයෝගිතා පදනම හෝ ශ්‍රී ලංකාවේ අනුමත පාලක සභා (ජාතික විද්‍යා පදනම, ජාතික පර්යේෂණ සභාව, ශ්‍රී ලංකා කෘෂි කාර්මික පර්යේෂණ සභාව) වෙනත් හෝ විශ්වවිද්‍යාල සඳහා පර්යේෂණ ප්‍රදානයන් යටතේ ලැබුණු අරමුදල් සඳහා හිමිකම් පවතින වසරේ දී, මෙම පර්යේෂණ කටයුතු දැනටමත් ආරම්භ කර ඇති බව සහ ඒ සඳහා සක්‍රීයව ක්‍රියාත්මක වන බවට අවශ්‍ය, ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර ඇතිවීම.

(iii) ඉහත (i) සහ (ii) ක්‍රමෝපායන් යටතේ, දැනටමත් පර්යේෂණ කටයුතු ආරම්භ නොකළ, අධ්‍යයන කාර්යයමණ්ඩලය විසින් පර්යේෂණ යෝජනාවලියක් ඉදිරිපත් කළ යුතුය. එහි පර්යේෂණයේ ස්වභාවය, කාල පරාසය සහ ක්‍රමවේදය සඳහන් කල යුතු අතර පරිච්ඡේද 04 ප්‍රකාරව, ඒ සඳහා වන පර්යේෂණ දීමනාවන් අදාල වර්ෂයේ දී එනම්, ජනවාරි පළවන දා සිට ක්‍රියාත්මක වන ලෙස ලබා ගැනීමට සුදුසුකම් ලත් අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් පර්යේෂණ සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(iv) දේශීය සහ විදේශීය ලෙස පර්යේෂණ කටයුතුන් හී නියත අධ්‍යයන නිවාඩු සහ සප්තවාර්ෂික නිවාඩු ලද අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් ඉහත (i) හී සඳහන් කල පරිදි සම්මන්ත්‍රණ සහ සමුළුන් හී ඉදිරිපත් කල පර්යේෂණ පත්‍රිකාවල පිටපත් ඉදිරිපත් කල යුතුය. (v) පහත පරිච්ඡේද (IV) හී සඳහන් කමිටුවට ඉදිරිපත් කිරීමට අදාල අධ්‍යයන ප්‍රකාශණ හෝ යෝජිත පර්යේෂණයන් හෝ අධ්‍යයන ප්‍රකාශණයන් සම්බන්දයෙන් වන යෝජනාවලිය හෝ පර්යේෂණ ප්‍රකාශණ හෝ යෝජනාවලියක් ඉදිරිපත් කිරීම.

මෙම පර්යේෂණ දීමනාවන් බහු කෘත්වයන් වෙනුවෙන් වුව ද ලබා ගත හැකි අතර ඒ සඳහා අදාල පිරිස් විසින් ඉල්ලීම් කල යුතු අතර එම ඉල්ලීම් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කමිටුව/ පීඨ කමිටුව මඟින් අනුමත කලයුතු වේ. එම කමිටුන්හි සභාපති හෝ බලයලත් නිලධාරියකු විසින් එම කමිටුවෙහි අනුමැතිය පිළිබඳව උප කුලපති වෙත දැනුම් දීමෙන් පසු ඒ අයට අදාල වර්ෂයේ ජනවාරි මස පළවනදා සිට පර්යේෂණ දීමනාවන් ලබා ගැනීම සඳහා අවස්ථාව හිමි වේ.

ඉහත ක්‍රියාවලිය අනුගමනය කරමින්, ඉහත සඳහන් පරිදි අවශ්‍ය අවම ලියකියවිලි 01ක් හෝ පීඨ පර්යේෂණ කළමණාකරණ කමිටුව (FRMC) වෙත ඉදිරිපත් කර කාර්යය මණ්ඩලය සඳහා වන පර්යේෂණ දීමනාවන් සඳහා ඉල්ලීම් සිදුකල හැක. පර්යේෂණ කලමනාකරණ කමිටු නිර්දේශය පරිදි, විශ්වවිද්‍යාලයේ පර්යේෂණ හා ප්‍රකාශණ කමිටුව විසින් අවම වශයෙන් ඉහත සාධකයන්ගෙන් එකක් හෝ සම්පූර්ණ කරනු ලබන කාර්යය මණ්ඩලය වෙත පර්යේෂණ දීමනාවන් ලබා ගැනීමට අනුමැතිය ලබා දේ.
බහුතරයක් කාර්යයමණ්ඩලය විසින් පර්යේෂණ සාක්ෂින් සහ පර්යේෂණ යෝජනාවන් මෙන්ම ඔවුන් විසින් හඳුනාගත් පර්යේෂණ නිපැයුම් අභ්‍යන්තර සමුළුන් සහ ප්‍රචලිත සඟරා එනම්, ස්කෝපස් (Scopus) සහ වෙබ් ඔෆ් සයන්ස් (Web of Science) තුල ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයීය උගත් පිරිස් (scholars of SEUSL) විසින් රටෙහි, ප්‍රාදේශීය සහ ජාතික සංවර්ධනය උදෙසා පර්යේෂණයන් සිදු කරනු ලැබේ.

පර්යේෂණ සම්බන්ධයෙන් වන නව නිපැයුම් සහ පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම ඉතා අවම තත්ත්වයක පවතී. කෙසේ වුවද, කාර්යය මණ්ඩලය විසින් වර්තමානයේ දී ඉතා බහුල වශයෙන් පර්යේශණයන් කිරීම සඳහා යොමු වී ඇති බැවින් අනාගතයේ දී නව නිපැයුම් සහ පේටන්ට් ලබා ගැනීම සම්බන්ධයෙන් අපේක්ෂාවන් තබාගත හැක.

විශ්වවිද්‍යාලයීය ව්‍යාපාරික සම්බන්ධීකරණ සෛල (University Business Linkage cell - UBL) මඟින් සහ ස්මර්ට් බින් (smart bin) මඟින් මෙම නව නිපැයුම් සහ පේටන්ට් හසුරුවනු ලබන අතර කාර්යය මණ්ඩලයේ පර්යේෂණ නිපැයුම් වාණිජකරණය කිරීම සඳහා ද මෙමඟින් කටයුතු කරනු ලැබේ.
(g) විශ්වවිද්‍යාලයේ දේශීය වශයෙන් සහ විදේශීය වශයෙන් වන ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීම සඳහා වෙබ් කමිටුවක් පත්කරනු ලැබිණි. එම කමිටුව විසින් අදාල කටයුතු සිදුකරමින් පවතී. (ඇමුණුම).

තව ද, පර්යේෂණ ප්‍රමාණයන් ඉහළ නැංවීම සහ උපුටා දැක්වීම් මෙන්ම පර්යේෂණයන් කිරීමට ශිෂ්‍යයන් නැඹුරු කිරීම සහ පෙළඹවීම සඳහා වන පියවරයන් සනාතන සභාව විසින් ගනිමින් පවතී. මෙමඟින් විශ්වවිද්‍යාලයේ ශ්‍රේණිය ඉහල නැංවේ යැයි අපේක්ෂා කෙරේ. තව ද, අප විසින් අපගේ කාර්යය මණ්ඩලය, වෙත උපුටා දැක්වීම් ඉහළනන්වන අයුරින් කටයුතු කිරීම දෛර්යමත් කරන අතර මෙමඟින් විශ්වවිද්‍යාලයීය වෙබ් මෙට්‍රික් ශ්‍රේණිගත කිරීම සඳහා ද දායකත්වය සපයනු ලැබේ.

(h)
ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨයෙහි විෂයමාලා සංශෝධනය

ප්‍රධාන විෂයමාලා සංශෝධනය සිදුකිරීම සඳහා වන මූලික පියවරයන් දැනටමත් ගෙන ඇති අතර මෙය, මෙම වර්ෂය තුල දී අවසන් කිරීමට නියමිතය. එමනිසා නව විෂය නිර්දේශය

2021/2022 අධ්‍යයන වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. නිසි කාලයේ දී විෂයමාලා සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ඉදිරි අනාගතයේ දී සිදු කිරීමට නියමිතය.

කලමනාකරණ සහ වාණිජ පීඨයෙහි විෂයමාලා සංශෝධනය

කළමණාකරණය සහ වාණිජ පීඨයෙහි, ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය සහ වාණිජවේදී උපාධින් සඳහා වන ප්‍රධාන විෂයමාලා සංශෝධනය කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පියවරයන් පීඨය විසින් දැනටමත් ක්‍රියාත්මක කර ඇති අතර එය ලබන වසරේ එනම් 2021/2022 අධ්‍යයන වර්ෂයේ සිට සම්පූර්ණ කිරීමට නියමිතය.

(i) LEARN පහසුකම් ලබාගත් මුල් අවධියේ දී පහත ගොඩනැගිලි පමණක් තිබූ බැවින්, එනම් පරිපාලන ගොඩනැගිල්ල, ඉංජිනේරු පීඨය (ඉදිරිපස ගොඩනැගිල්ල), පුස්තකාලය, වැඩ දෙපාර්තමේන්තු පෙදෙස, යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුව සහ ව්‍යවහාරික විද්‍යා පීඨයෙහි යම් යම් ප්‍රදේශ සඳහා පමණක් අන්තර්ජාල පහසුකම් ලබාදෙනු ලැබුණි.

කෙසේ වුවද, නව ගොඩනැගිලි එනම්, කලා සහ සංස්කෘතික පීඨය, කලමනාකරණ සහ වාණිජ පීඨය, ඉස්ලාමීය අධ්‍යයනය සහ අරාබි භාෂා පීඨය, ඉංජිනේරු පීඨය / සිවිල් සහ තාක්ෂණ පීඨය සහ ව්‍යාවහාරික විද්‍යා පීඨයේ පරිපාලන ගොඩනැගිල්ල ආදිය LEARN පහසුකම් ලබා ගැනීමෙන් අනතුරුව පසු කාලීන ව ඉදිකල අතර එම ගොඩනැගිලි පවතින ප්‍රදේශ සඳහා LEARN සබඳතා ලබා ගැනීමට අවශ්‍ය LAN කේබල් සම්බන්දතා නොපැවති අතර එම LAN කේබල් සම්බන්දතා ලබා ගැනීමට විශාල මුදලක් මෙන්ම කාලයක් අවශ්‍ය විය.

මෙම ප්‍රදේශයන්ගේ කාර්යය මණ්ඩලය සහ සිසුන් සඳහා මෙම අන්තර්ජාල පහසුකම් ඉතා ඉක්මනින් අවශ්‍ය වූ බැවින්, විශ්වවිද්‍යාලය විසින් මෙම ප්‍රදේශවල පවතින ගොඩනැගිලි වෙත LAN කේබල් සම්බන්දතා පහසුකම් ලබා ගන්නා තෙක් මොබිටෙල්- Wi-Fi අන්තර්ජාල පහසුකම් ලබා ගැනීමට කටයුතු කෙරිණි.

පසුව, 2020 වසරේ දී, මෙම LAN කේබල් සම්බන්දතා පහසුකම් ලබා ගත් අතර ව්‍යාවහාරික විද්‍යා පීඨයේ සමහරක් ප්‍රදේශවල පැවැති මොබිටෙල්- Wi-Fi පහසුකම් නතර කෙරිණි. මෙමඟින් මසකට රු. 250,000/- ඉතිරි කර ගැනීමට හැකිවිය. 2021 වර්ෂයේ දී, LAN කේබල් සම්බන්දතා පහසුකම් සම්පූර්ණ වශයෙන්ම ලබාගත් අතර LEARN සබඳතා කලා සහ සංස්කෘතික පීඨ ගොඩනැගිලි සඳහා ද ලබා ගනිමින් මොබිටෙල්- Wi-Fi සබඳතා නවතාලීමට කටයුතු කෙරිණි. මෙමඟින් මසකට රු. 150,000 ඉතිරි කර ගැනීමට හැකිවිය.

වර්තමානයේ දී, කලමනාකරණ සහ වාණිජ පීඨය, ඉස්ලාමීය අධ්‍යයනය සහ අරාබි භාෂා පීඨය, තාක්ෂණ පීඨය සහ ඉංජිනේරු පීඨය (නව ගොඩනැගිල්ල) සඳහා මොබිටෙල්- Wi-Fi පහසුකම් ලබාගෙන ඇත. මෙම ප්‍රදේශ සඳහා LEARN සබඳතා ලබා ගැනීමට වන LAN කේබල් සම්බන්දතා පහසුකම් ලබා ගැනීමට අදාල යෝජනාවලිය සකසමින් පවතී. කෙසේ වුවද, වර්තමාන මුල්‍ය අපහසුතා සැලකිල්ලට ගෙන මෙම යෝජනාවලීන් ක්‍රියාවට නැංවීම ප්‍රමාදව පවතී.

(j) අධ්‍යයන ශ්‍රේණි:

අධ්‍යයන පුරප්පාඩු 424ක් පවතිනුයේ ස්ථීර තනතුරු වෙනුවෙන් පුරප්පාඩු 288ක් සහ තාවකාලික තනතුරු සඳහා පුරප්පාඩු 136ක් ලෙසිනි. මේවන විට ස්ථීර පුරප්පාඩු 249ක් පිරවීමට හැකි විය.සුදුසුකම් ලත් ගුණාත්මක අයදුම්කරුවන් නොමැති බැවින් සහ රටේ පවතින වර්තමාන තත්ත්වය සැලකිල්ලට ගනිමින් භාණ්ඩාගාරය විසින් ගනු ලැබූ බඳවා ගැනීම් තහනම් කිරීම් නිසා මෙම ඉතිරි පුරප්පඩු 39 සපුරාලීමට නොහැකි වී ඇත. මෙම තාවකාලික පුරප්පාඩුන් කෙටි කාලීන අයුරින් පිරවීමට කටයුතු කරනු ලැබේ. මෙම තාවකාලික පුරප්පාඩු බහුල වශයෙන් සපුරලනු ලබනුයේ විශ්වවිද්‍යාලයේ උපාධිලත් පිරිසෙණි. එම තාවකාලික පුරප්පාඩු ඇති වූ විගසම එම පුරප්පාඩු පිරවීමට ඉක්මන් පියවර ගනු ලැබේ.

අනධ්‍යයන ශ්‍රේණි:

- UPL ශ්‍රේණි සඳහා බඳවා ගැනීම සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අත්හිටුවා ඇත. II ශ්‍රේණිය යන්ත්‍ර ක්‍රියාකරු, II ශ්‍රේණි තවාන්කරු, II ශ්‍රේණි උයන්කරු, II ශ්‍රේණි රියදුරු සහ ගෘහකම්කරු (පහල ශ්‍රේණි), පුස්තකාල කම්කරු සහ වෙනත්.
- III ශ්‍රේණිය කළමණාකාර සහකාර (බාහිර අංශය) තනතුරු සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදු වූ අතර තේරුම් කමිටුවේ නිර්දේශ, පාලක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.
- III ශ්‍රේණිය කළමණාකාර සහකාර (අභ්‍යන්තර අංශය) සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් අදාල බඳවා ගැනීමේ කටයුතු සිදුකල යුතුය.
- III ශ්‍රේණිය කාර්මික නිළධාරීන් (ICT) සඳහා අයදුම්පත් කැඳවනු ලැබුණු අතර පුහුණු කාර්මික නිළධාරීන් සඳහා වන ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී.
- II ශ්‍රේණිය උප පාලක (පූර්ණ කාලීන) සහ II ශ්‍රේණිය මාර්ෂල් සඳහා පත්වීම් ලබා දීම සිදුවිය.
- PHI සහ ඖෂධවේදී සඳහා අයදුම්පත් කැඳවනු ලැබුණි. එහෙත් ඒ සඳහා සුදුසුකම්ලත් අයදුම්පත් නොලැබුණි.

(k) අනපේක්ෂිත කොවිඩ්-19 තත්ත්වයන් සහ අදාල දෙපාර්තමේන්තු/ඒකක වෙත වෙන්කරනු ලැබූ මූල්‍ය සම්පත්වල හිඟයන් පවතින බැවින්, මෙම ක්‍රියාවලීන් ආරම්භ කිරීමට නොහැකි විය. ප්‍රමාණවත් මූල්‍ය තත්ත්වයක් ලැබේ යැයි අපේක්ෂාවෙන් මෙම සැලසුම් සකසන ලදී. කෙසේ වුවද, ක්‍රියාකාරී සැලැස්මෙහි අප විසින් බලාපොරොත්තු වූ පරිද්දෙන් මූල්‍ය වෙන්කිරීමක් සිදු නොවේ. මෙය, සෑම වසරක් සඳහාම වන අඛණ්ඩ හේතුවක්ව පවතී. අදාල පීඨාධිපතිවරුන්/ප්‍රධානීන් සහ ඒකකයන්ගේ වාර්තාවල මෙම ආරම්භ කිරීම් නොකිරීම සම්බන්ධව හේතු දක්වා ඇත.

(l)

වර්ෂය	පීඨය	නිළධාරීන් සංඛ්‍යාව	ලබා දුන් ප්‍රදානය රු.	පර්යේෂණ කටයුතු අවසන් කර ඇති නිළධාරීන් සංඛ්‍යාව	වර්තමාන තත්ත්වය

2017	FE	2	198000.00	1	එක් කාර්යය මණ්ඩල නිළධාරියකු – සම්පූර්ණ කර ඇත. එක් කාර්යය මණ්ඩල නිළධාරියකු - ඉල්ලා අස්කර ගනු ලැබිණි.
	FIA		253000.00		
2018	FMC	6	101235.00	6	කාර්යය මණ්ඩල නිළධාරීන් හය දෙනෙකු - සම්පූර්ණ කර ඇත.
	FAS		210000.00		
	FAS		400000.00		
	FAS		500000.00		
	FMC		200000.00		
	FMC		50000.00		
2019	FAS	8	402700.00	4	කාර්යය මණ්ඩල නිළධාරීන් හතර දෙනෙකු - සම්පූර්ණ කර ඇත. කාර්යය මණ්ඩල නිළධාරීන් දෙදෙනෙකු – ඉල්ලා අස්කර ගනු ලැබිණි. කාර්යය මණ්ඩල නිළධාරීන් දෙදෙනෙකු – පර්යේෂණ කටයුතු සිදුකරමින් පවතී
	FE		590000.00		
	FIA		505750.00		
	FAS		495850.00		
	FMC		290000.00		
	FMC		300000.00		
	FMC		260000.00		
	FMC		100000.00		
2020	FE	4	200000.00	1	එක් කාර්යය මණ්ඩල නිළධාරියකු – සම්පූර්ණ කර ඇත. කාර්යය මණ්ඩල නිළධාරීන් තිදෙනෙකු – පර්යේෂණ කටයුතු සිදුකරමින් පවතී
	FE		500000.00		
	FE		489000.00		
	FE		499950.00		
2021	FAS	11	504440.00		කාර්යය මණ්ඩල නිළධාරීන් එකලොස්දෙනෙකු– පර්යේෂණ කටයුතු සිදුකරමින් පවතී
	FT		249300.00		
	FT		994957.00		
	FE		580000.00		
	FAS		499800.00		
	FMC		546000.00		
	FMC		240000.00		
	FT		980466.00		
	FT		999913.00		
	FAS		396461.00		
	FAS		497000.00		

2017 වර්ෂයේ දී, එක් කාර්යය මණ්ඩල නිළධාරියකු විසින් පර්යේෂණ කටයුතු සම්පූර්ණ කර ඇති අතර එක් කාර්යය මණ්ඩල නිළධාරියකු විසින් රටෙහි පවතින වර්තමාන තත්ත්වය

සලකා බලා පර්යේෂණ කටයුතු වෙනුවෙන් ලබාගත් අර්ධ ප්‍රදානයන් නැවත ආපසු ගෙවීම් සිදුකර පර්යේෂණ කටයුතු ඉල්ලා අස්කර ගනු ලැබුණි.

2019 වර්ෂයේ දී, කාර්යය මණ්ඩල නිළධාරින් හතර දෙනෙකු විසින් පර්යේෂණ කටයුතු සම්පූර්ණ කර ඇති අතර ඔවුන් විසින් අවසාන වාර්තාවන් ඉදිරිපත් කර ඇත. කාර්යය මණ්ඩල නිළධාරින් දෙදෙනෙකු විසින් කිසිදු පර්යේෂණ ප්‍රදානයන් භාවිතා කිරීමකින් තොරව පර්යේෂණ කටයුතුවලින් ඉල්ලා අස්විය. තව ද, කාර්යය මණ්ඩල නිළධාරින් දෙදෙනෙකු විසින් ඔවුන්ගේ පර්යේෂණ කටයුතුවල අවසාන අදියරන්ගේ පවතින අතර අවසාන වාර්තාව සකසමින් පවතී.

2020 වර්ෂයේ දී, එක් කාර්යය මණ්ඩල නිළධාරියකු විසින් පර්යේෂණ කටයුතු සම්පූර්ණ කර ඇත. කාර්යය මණ්ඩල නිළධාරින් තිදෙනෙකු විසින් රටෙහි පවතින වර්තමාන තත්ත්වය සහ කොවිඩ්- 19 තත්ත්වය සැලකිල්ලට ගෙන පර්යේෂණ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා 2022.12.31 දින දක්වා කාලය දීර්ඝ කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත.

(m) 2020 වර්ෂය සඳහා වන ග්‍රන්ථ සත්‍යාපනය කිරීමේ කටයුතු 2020 වර්ෂයේ දීම සිදුකිරීමට සැලසුම් කරන ලදී. එහෙත්, කොවිඩ්-19 වැනි අනපේක්ෂිත තත්ත්වයක් සහ පසුව පැවැති රට වසා දැමීම වැනි තත්ත්වයන් උත්ගත වූ බැවින් මෙම සත්‍යාපනය කිරීමේ කටයුතු සිදු කිරීමට නොහැකි විය. මෙම ග්‍රන්ථ එකතුව 100,000 පමණ වැඩි ප්‍රමාණයක් පවතින බැවින් මෙම ග්‍රන්ථ සත්‍යාපනය කිරීමේ කටයුතු සඳහා විශාල කාර්යය මණ්ඩල ප්‍රමාණයක් අවශ්‍ය වේ. **2020** සහ **2021** වර්ෂ වල පැවැති අනපේක්ෂිත තත්ත්වයන් හේතුවෙන් බෝහෝ සේවක පිරිසක් නිවසේ රැදෙමින් රාජකාරි කටයුතු සිදුකිරීමට සිදුවිය. මේවන විට සියලුම පීඨ වල සිසුන් විභාග සඳහා පෙනීසිටීමට විශ්වවිද්‍යාල වෙත කැඳවා ඇත. එමනිසා පුස්තකාලය සම්පූර්ණ වශයෙන්ම සිසුන්ගෙන් පිරී පවතින අතර විභාග කටයුතු වෙනුවෙන් ඔවුන් පුස්තකාලය භාවිතා කරමින් පවතී. මෙම ග්‍රන්ථ සත්‍යාපනය සිදු කිරීමේ දී, පුස්තකාල සේවා, එනම් ග්‍රන්ථ ලබාදීමේ කටයුතු සම්පූර්ණයෙන්ම නවත්වාලිය යුතු අතර එමඟින් සිසුන් විභාග සඳහා සුදානම් වීම සඳහා බාධා ඇති කරනු ලැබේ. කෙසේ වුවද, **33** වන ජ්‍යෝෂ්ඨ කාර්යය මණ්ඩල කමිටුවේ දී ග්‍රන්ථ සත්‍යාපනය සිදු කිරීම සහ ඒ සඳහා අවශ්‍ය වන මූලික පියවරයක් ගනු ලැබුණි. මෙම විභාග කටයුතු අවසන් වූ විගස මෙම සත්‍යාපන කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

මහාචාර්ය ඒ. රමීස්
උප කුලපති
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

පිටපත: සහකාර අභ්‍යන්තර විගණක

අමුණුම

South Eastern University of Sri Lanka

Internal Audit <internalaudit@seu.ac.lk>

Fwd: Updating the Google Scholar and ResearchGate Profiles of Staff

1 message

Vice Chancellor, South Eastern University of Sri Lanka <vcseu@seu.ac.lk> Thu, Sep 1, 2022 at 11:50 PM
To: Internal Audit <internalaudit@seu.ac.lk>, "Thahir S.L.M. slmthahir" <slmthahir@seu.ac.lk>

Dear all,

Pls check the mail below in relation to ranking of our University. I have appointed a Web-Committee to elevate the ranking of the University locally and globally that is now in the process of doing so.

You can quote this initiative to the query on ranking of the University by General Audit.

Thank you.

VC

---------- Forwarded message ---------
From: **Vice Chancellor, South Eastern University of Sri Lanka** <vcseu@seu.ac.lk>
Date: Fri, 2 Sep 2022 at 10:16 AM
Subject: Updating the Google Scholar and ResearchGate Profiles of Staff
To: Academic Staff SEUSL <all-academic-staff@seu.ac.lk>
Cc: Deans <deans@seu.ac.lk>, Registrar SEUSL <registrar@seu.ac.lk>, Academic Heads <academic-heads@seu.ac.lk>, MZM Rizan <mzmrizan@seu.ac.lk>

Dear Academics,

I am very much pleased to know that almost all of our academic staff have their presence on Google Scholar, which is a freely available web search engine that indexes the entire text or metadata of academic publications and ResearchGate, which is a social networking website where researchers and academics share their publications and engage with each other. This enables our university to make an impact in academia. Hence, I would like to invite and insist all Deans of faculties and Heads of departments to encourage all their staff to keep on updating their profiles on Google Scholar, ResearchGate, ORCID and the like with latest publication details which will improve the visibility of their research work and beacon citation from academics across the globe.

At the same time, it has been brought to my notice by our Web Team that some of our academics' profiles on Google Scholar and ResearchGate consist of academic works of others (with similar names to our staff). This does not happen intentionally. Sometimes, we might have accidently "accepted" the suggestions emailed to us by Google Scholar or ResearchGate so that all works of outsiders are listed under our staff's profile. However, this has been taken seriously by some world University Ranking entities such as Webometrics. They deem this as BAD PRACTICE and INTENTIONAL to improve our Ranking. This will sometimes result in EXCLUSION of our university from their ranking. They have categorically mentioned that "If multiple profiles of authors not belonging to the University are added intentionally to increase its rank, the institution will be EXCLUDED of the ranking." (https://www.webometrics.info/en/transparent). Therefore, I would like to suggest and encourage our staff to take this matter seriously and clean their profiles up-to-date as soon as possible.

Furthermore, it is noted that some of our staff who have gone abroad to pursue their higher studies have changed their Google Scholar profile's email to their generic email address such as from Gmail. This practice should be avoided. As academic staff attached to the SEUSL, they should make sure that their Google Scholar profile's email address is from the SEUSL domain i.e., the email address containing "seu.ac.lk".

Also, I would like to invite all Heads of departments to request their newly recruited academic staff to update their Google Scholar, ResearchGate and ORCID profiles using our UNIVERSITY EMAIL addresses (this applies to all our staff).

As responsible academic members of the University, let's strive together to elevate the ranking of our University globally and locally.

Thank you

Prof.A.Rameez, Ph.D (NUS), M.Phil (UPDN), PGD (UoB-UK), B.A.Hons.(SEUSL)